# පුස්තකාල ප්‍රවෘත්ති

# நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

**THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA**

08 MAR
SRI LANKA

19 වන වෙළුම. 3 වන කලාපය / 1998 ජූලි - සැප්තැම්බර්

மலர் 19. இதழ் 3/ யூலை - செப்ரெம்பர் 1998

**Vol:19. No. 3 / July - September 1998**

**ISSN 1391 - 0000**

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කොළඹ 07, අංක 14, නිදහස් මාවතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂකයන් සහ විද්වතුන් සඳහා විවෘතව පවතී. මෙය අපගේ ජාතික පුස්තකාලය බැවින් රටේ ඕනෑම පෙදෙසක වෙසෙන පාඨකයන් හට එය භාවිතා කළ හැක. පහත දැක්වෙන එකතුන් ජාතික පුස්තකාලය සතුව පවතී

* විමර්ශන ග්‍රන්ථ - විශ්වකෝෂ, ශබ්ද කෝෂ, වාර්ෂික ග්‍රන්ථ, සිතියම් සහ දුර්ලභ කෘතීන්
* පුවත්පත් (1976 වසරේ සිට) සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ කාලීන ජාත්‍යන්තර පුවත්පත්.
* වාර සඟරා - දේශීය සහ විදේශීය
* ජාතික සහ අන්තර් ජාතික ප්‍රවෘත්ති සඟරා
* විද්‍යා හා තාක්ෂණික ග්‍රන්ථ එකතුව
* පුස්තකාල විද්‍යා ග්‍රන්ථ එකතුව
* යුනෙස්කෝ පොත් එකතුව
* පැරණි පුස්කොළ පොත් එකතුව
* ආර්ථික විද්‍යා, දේශපාලන විද්‍යා, සමාජ විද්‍යා, ආගම්, භාෂා, සාහිත්‍ය, භූගෝල විද්‍යා, ඉතිහාසය, චිත්‍ර, කලා සංගීත සහ ක්‍රීඩා පොත්පත්
* පරිගණක සහ විමර්ශන සේවා (CDROM) Science Citation Index, Library & Information Science Ab stracts (LISAP LUS) HORTCD' and ' Current Contents on Diskette.'
* සේවාවන් : විමර්ශන, ලේඛන සැපයීම්, අන්තර් පුස්තකාල පිරුළු, ග්‍රන්ථ විඥාපන, ඒකාබද්ධ සූචිය සහ වෙනත් පුස්තකාල සේවා
* ආයතන සඳහා විශේෂ සාමාජිකත්ව පහසුකම් සැලසේ

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය**
**අඟහරුවාදා සිට සෙනසුරාදා**
**දක්වා**
**පෙ.ව. 9.00 සිට ප.ව. 5.00**
**දක්වා විවෘතව පවතී**

විස්තර සඳහා
අංශ ප්‍රධාන
පාඨක සේවා අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
අංක 14, නිදහස් මාවත
කොළඹ - 07

දුරකථනය අංක : 685199, 698847 ෆැක්ස් 685201

287947


# පුස්තකාල ප්‍රවෘත්ති

## நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය ஆரம்பம் Established 1973


08 MAR 2000 SRI LANKA


19 වන වෙළුම 3 වන කලාපය
1998 ජූලි - සැප්තැම්බර්



සංස්කාරක උපදේශක මණ්ඩලය
**හෙන්රි සමරනායක**
සභාපති

**එම්. එස්.යූ. අමරසිරි**
අධ්‍යක්ෂ

**ජානකී ප්‍රනාන්දු**
සහකාර අධ්‍යක්ෂ

**ප්‍රධාන සංස්කාරක**
යූ. පී. අලහකෝන්

**සහාය සංස්කාරක**
ශ්‍රීමා සූරියබණ්ඩාර

**විශේෂ සංස්කාරක**
ජී. ආරියදාස



**ප්‍රකාශනය**
ප්‍රකාශන අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකථනය : 687583,698847 -261
ෆැක්ස් : 941 - 685 - 201


© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1998


කලාපයක මිල රුපියල් 25.00 $ 2.50
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් හා මුදල් ඇණවුම්පත්

**සභාපති**
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නමට යොමුකරන්න

**මුද්‍රණය**
සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ

மலர் 19 இதழ் 3
ஜூலை - செப்ரெம்பர் 1998



பதிப்பாசிரியர் ஆலோசனைக் குழு
**ஹென்றி சமரநாயக்க**
தலைவர்

**எம்.எஸ்.யு. அமரசிறி**
நெறியாளர்

**ஜானகி பெர்னாண்டோ**
உதவி நெறியாளர்

பிரதம பதிப்பாசிரியர்
யூ .பீ. அழகக்கோன்
உதவிப் பதிப்பாசிரியர்
சிறீமா சூரியபண்டார
விசேட பதிப்பாசிரியர்
ஜீ. ஆரியதாச



வெளியீட்டுப் பிரிவு
சிறீ லங்கா தேசிய நூலகம்
சிறீ லங்கா தேசிய நூலக
சேவைகள் சபை
சுதந்திரவழி, கொழும்பு 07
சிறீ லங்கா

தொலைபேசி 687583,698847 - 261
பெக்ஸ் 941-685-201


© சிறீ லங்கா தேசிய நூலகம் 1998


பிரதியின் விலை ரூபா- 25.00 $ 2.50
ஆண்டுச் சந்தா ரூபா - 100/=
சகல காசோலைகளும், நாணய கட்டளைகளும்

**தலைவர்**
சிறீ லங்கா தேசிய நூலக
சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட
வேண்டும்.

**அச்சுப் பதிப்பு**
சமயவர்த்தன பிரிண்டர்ஸ்

**Volume 19 No.3**
July - September 1998



Editorial Advisory Board
**Henry Samaranayake**
Chairman

**M.S.U. Amarasiri**
Director

**Janaki Fernado**
Asst.Director

**Editor in Chief**
U. P. Alahakoon

**Asst. Editor**
**Srima Suriyabandara**

**Special Editor**
G. Ariyadasa



**Published by**
Publication Division
National Library of Sri Lanka
Sri Lanka National Library
Services Board
Independence Avenue, Colombo 07.
Sri Lanka.

Tel. 687583, 698847 - 261
Fax : 941 - 685 -201


© National Library of Sri Lanka 1998


Price per Copy Rs. 25.00 $ 2.50
Annual Subscription Rs.100
All Cheques and Money Order
should be forwarded to

**Chairman**
**Sri Lanka National Library Services Board**

**Printed by**
Samayawardhana Printers

# පටුන

කතුවැකිය 03

පුවත් 04

செய்திகள் 05

NEWS 06

ආචාර්ය එස්.ආර්. රංගනාදන්: ජීවිතය සහ වෘත්තීය දායකත්වය 07 - 12
ඩබ්ලිව්. කේ. එම්. එම්. කේ. වීරසිංහ

Locating U.S. Government Information on the World Wide Web 14 - 16
Steven Kerchoff.

ප්‍රාථමික ළමයින් තුළ කියවීමේ පුරුදු හා විඥාපන කුසලතා වැඩි දියුණු කිරීම 17 - 22
නන්දා නාරංගොඩ

287947

පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර
රෙජිස්ට්‍රාර් කාර්යාලය
08 MAR 2000
ශ්‍රී ලංකා SRI LANKA

## කතුවැකිය

# කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීම

පොත පත කියවීම අනාදිමත් කාලයක සිට පැවත එන මානව ක්‍රියාකාරකමකි. අක්ෂර සහ ලේඛනය බිහි වූ දින සිට කියවීමේ පුරුද්ද මානව සමාජයේ අවියෝජනීය අංගයක් බවට පත් වූ බව පැහැදිලි කරුණකි. මිනිසාගේ බුද්ධිය නැතහොත් මොළයේ ක්‍රියාකාරිත්වය පරිණාමයට පත් වීමත් සමග ඔවුනගේ බුද්ධිමය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල අස්වැන්න ගබඩා කරන සහ ඒවා අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කරන මාධ්‍ය ලෙසින් පොත පත වැඩි වැඩියෙන් බිහි වන්නට විය. මෙලෙසින් මානවයාගේ ඥානය මෙන් ම වින්දන තලය ද ඉහළ මට්ටමකට නැංවීම උදෙසා පොත පත කියවීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වේ. දැනුමෙන් පිරිපුන් ජනතාවක් සිටීම වර්තමානයේ දැනුම පාදක සමාජයක (Knowledge based society) කේන්ද්‍රීය මෙන් ම ගාමක බලවේගය ලෙසින් ද සැලකේ. එමෙන්ම, නූතන ඉලෙක්ට්‍රොනික සමාජ වට පිටාවක වුව ද මිනිසා වෙත දැනුම ලබා ගැනීමේ ප්‍රධානත ම මාධ්‍ය ලෙසින් විරාජමානව සිටීමට පොත පතට හැකියාව ලැබීම ඊට ම අනන්‍ය වූ නෛසර්ගික ප්‍රබලත්වයට මාහැඟි නිදසුනකි.

එහෙත් වසර ගණනාවක සිට කියවීමේ පුරුදු ලාංකීය ජන සමාජයෙන් කෙමෙන් වියැකී යන බව මෑත කාලයේ පවත්වන ලද විවිධ සමීක්ෂණ මගින් හෙළිදරව් වී තිබේ. සෑම තරාතිරමකම සමාජ කොටස්වල මෙම ලක්ෂණය විද්‍යමාන වීම එහි බැරෑරුම් බව තවදුරටත් වැඩි කරයි. මීට හේතු කවරේ ද ? මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද ? යන්න අද දවසේ සුවිශේෂ අවධානයට ලක් විය යුතු කරුණු ලෙස සැලකිය හැකිය. විශේෂයෙන් අද්‍යතන සිසු පරපුර වෙතින් කියවීමේ පුරුදු බැහැර වීම යනු අනාගත සමාජයේ ස්වරූපය පිළිබඳව කරනු ලබන භයානක ඉඟියකි.

වර්තමාන සමාජයේ පවතින තරඟකාරීත්වය, අධ්‍යාපන ක්‍රමයේ යාන්ත්‍රික ස්වරූපය, පොත පතට විකල්ප මාධ්‍ය බහුලත්වය වැනි නන්විධ කරුණු මෙම තත්ත්වයට බලපා ඇති බව විද්වතුන්ගේ මතයයි. පාසල් සිසුන් වර්තමානයේ අත් විඳින අවිවේකී ජීවන රටාව හේතු කොට ඔවුන් පොත පතින් බැහැර වීම ස්වභාවිකය. මන්ද පොතක් හෝ පුවත්පතක්, හෝ සඟරාවක් කියවා දැනුම ලබා ගැනීමට හෝ රස විඳීමට විවේකී මානසික වාතාවරණයක් අවශ්‍ය බැවිනි.

කියවීම් පුරුදු ජන සමාජයට පුරුදු පුහුණු කිරීමේ තිඹිරි ගෙය විය යුත්තේ පාසල බව රහසක් නොවේ. මෙම කාර්යයෙහිලා ගුරුවරයාගේ සහ ශිෂ්‍යයාගේ පමණක් නොව පාසල් පුස්තකාලයේ භූමිකාව ද බෙහෙවින් තීරණාත්මක වේ. සිසුන්ගේ කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීම උදෙසා පාසල් පුස්තකාලයට දියත් කළ හැකි වැඩ සටහන් අපමණය. මෙයට අමතරව කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීමෙහිලා ජනමාධ්‍ය මගින් ඉටු කළ හැකි මෙහෙය ද සුවිශාලය. වැඩි ප්‍රේක්ෂක පිරිසක් එකවර ආකර්ෂණය කර ගැනීමේ ශක්‍යතාවෙන් අනූන රූපවාහිනිය වැනි විද්‍යුත් මාධ්‍ය මෙම කාර්යය උදෙසා භාවිත කිරීම පිළිබඳ ලාංකීය අත්දැකීම එතරම් සතුටුදායක මට්ටමක නොපවතී. රූපවාහිනිය වැනි විද්‍යුත් මාධ්‍ය කෙරෙහි බෙහෙවින් ඇලුම් කරන පරපුරක කියවීමේ පුරුදු වර්ධනය සඳහා එම මාධ්‍යයම භාවිත කිරීම බෙහෙවින් ඵලදායි වනු ඇත.

අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ එයට අනුබද්ධිතව සිදු සිදු කෙරෙන පුස්තකාල සංවර්ධන කටයුතු පාසල් ළමයින්ගේ කියවීමේ පුරුදු අභිවෘද්ධිය සඳහා වන ශක්තිමත් පදනමක් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

**විශේෂ සංස්කාරක**

# පුවත්

## ජාතික පුස්තකාල දේශන මාලා

1998 ජුලි - සැප්තැම්බර් කාලය තුළ ජාතික පුස්තකාල දේශන මාලා යටතේ පවත්වා ඇති දේශන මාතෘකා සහ දේශකයන් පහත දැක්වේ.

| දේශක | මාතෘකාව |
|---|---|
| 1. අශෝක හඳගම මහතා | රූපවාහිනී මායාව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව 1998 - 07 - 31. |
| 2. හෙන්රි. එන්. මෙඩ්ල්සන් මහතා | Books and Technology: partners in progress 1998 - 8 - 26. |
| 03. ආචාර්ය ගාමිණී කොරයා | Sri Lanka in a changing world 1998 - 9 - 11. |

## පුහුණු පාඨමාලා

1998 ජුලි - සැප්තැම්බර් කාලය තුළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා පහත දැක්වේ.

| දිනය | ස්ථානය |
|---|---|
| ජුලි 4 - 5 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ දී, පාඨමාලාලාභීන් 85ක් සහභාගි විය. |
| ජුලි 13 -14 | කොළඹ අධ්‍යාපන කලාපයේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල සේවා මණ්ඩලයේ දී, පාඨමාලාලාභීන් 49 දෙනෙක් සහභාගි විය. |
| ජුලි 16 - 17 | බියගම අධ්‍යාපන කොට්ඨාශයේ සපුගස් කන්ද විශාකා විද්‍යාලයේ දී, පාඨමාලාලාභීන් 85 දෙනක් සහභාගි විය. |
| ජුලි 29 - 30 | මාතර දිස්ත්‍රික්කයේ හක්මන කලාපයේ නාරංදෙනිය මධ්‍ය මහා විද්‍යාලයේ දී, පාඨමාලාව සඳහා 85 දෙනෙක් සහභාගි විය. |
| සැප්. 8 - 10 | වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව අධ්‍යාපන කලාපයේ පාසැල් පුස්තකාලාධිපතීන් සඳහා පාඨමාලා ලාභීන් 50ක් සහභාගි විය. |
| සැප්. 12 - 14 | මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාපයේ අකුරැස්ස පුහුණු මධ්‍යස්ථානයේ දී පාසැල් පුස්තකාලයාධිපතීන් සඳහා පාඨමාලා දෙකක් පවත්වන ලදී. පාඨමාලාලාභීන් 52ක් සහභාගි විය |
| සැප් 19 - 21 | මාතලේ දිස්ත්‍රික්කයේ පාසැල් හා පිරිවෙන් පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු පාඨමාලා දෙකක් පවත්වන ලදී. පාඨමාලාලාභීන් 52ක් සහභාගි විය |
| සැප් . 25 - 27 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා සම්පත් මධ්‍යස්ථානයේදී, පාඨමාලාලාභීන් 57ක් සහභාගි විය. |
| අගෝස්තු 28 - 30 | ගාල්ල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල සහායකයින් පුහුණු කිරීම තෙලිජ්ජවිල කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ දී, පාඨමාලාලාභීන් 58ක් සහභාගි විය. |

# செய்திகள்

## தேசிய நூலகப் பேருரைத் தொடர்

1998 யூலை - செப்ரெம்பர் காலப் பகுதியில் தேசிய நூலக பேருரைத் தொடரின் கீழ் வழங்கப்பட்ட பேருரைகளினதும் அவற்றை வழங்கிய விரிவுரையாளர்களினதும் விபரங்கள் கீழே தரப்பட்டுள்ளன.

| விரிவுரையாளர் | | தலைப்பு |
|---|---|---|
| திரு. அசோக ஹந்தகம | - | தொலைக் காட்சி ஊடகமும், கட்புல செவிப்புல நுட்பங்களும் |
| திரு. என். மெடெல்சன் | - | Books and technology: partners and progress |
| திரு. காமினி கொறாயா | - | Sri Lanka in a changing world |

## நூற் கண்காட்சிகள்

இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையால் கீழ்க் காட்டப்பட்டுள்ள நூற் கண்காட்சிகள் ஒழுங்கு செய்யப்பட்டிருந்தன.

செப்ரெம்பர் 8-18 - பொது நூலகம், கொழும்பு

செப்ரெம்பர் 10-12 - பொது நூலகம், பத்தேகம

செப்ரெம்பர் 22-28 - இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை

## பயிற்சி வகுப்புக்கள்

இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையானது 1998 ஆம் ஆண்டு யூலை - செப்ரெம்பர் காலப் பகுதியில் பின்வரும் பயிற்சி நெறிகளை நடத்தியது.

யூலை 13-14 - கொழும்பு கல்வி வலயம்
44 பயிலுநர்கள் பங்கு பற்றினர்

யூலை 16-17 - பியகம கல்விப் பிரிவு
30 பயிலுநர்கள் பங்கு பற்றினர்

யூலை 29-30 - ஹக்மன கல்வி வலயம்
85 பயிலுநர்கள் பங்கு பற்றினர்

ஆகஸ்ட் 8-10 - இப்பாகமுவ கல்வி வலயம்
50 பயிலுநர்கள் பங்கு பற்றினர்

செப்ரெம்பர் 12-14 - மாத்தளை கல்வி வலயம்
69 பயிலுநர்கள் பங்கு பற்றினர்

செப்ரெம்பர் 19-27 - மாத்தறை மாவட்டம்
52 பயிலுநர்கள் பங்கு பற்றினர்

செப்ரெம்பர் 25-27 - அநுராதபுர மாவட்டம்
57 பயிலுநர்கள் பங்கு பற்றினர்

*பொது நூலகர்கள்*
ஆகஸ்ட் 28-30 - விவசாயப் பயிற்சி நிலையம், தெலிஜ்ஜவில - காலி

## சர்வதேச நிகழ்ச்சிகள்

1. 1998 ஆகஸ்ட் 4-28 ஆம் திகதிகளில் ஐக்கிய அமெரிக்காவின் வாஷிங்டன் நகரில் USIA சர்வதேச விருந்தினர்கள் நிகழ்ச்சி ஒன்று நடத்தப்பட்டது. இந் நிகழ்ச்சியில் இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையின் பணிப்பாளர் திரு. எம்.எஸ்.யு. அமரசிறி பங்குபற்றினார்

2. 1998 யூலை மாதம் 1-28 ஆம் திகதிகளில் மலேசியாவின் கோலாலம்பூர் நகரத்தில் ஆசிய மற்றும் கடல் சார் நாடுகளைச் சேர்ந்த நூலகர்களுக்கான பயிற்சி நெறி ஒன்று நடத்தப்பட்டது. இப் பயிற்சி நெறியில் இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையின் நூலகர் திரு. ஜீ.டீ. அமரசிறி பங்கு பற்றினார்

# NEWS

## National Library Lecture Series

Following are the topics and lecturers of the National Library lecture series during the period of July - September 1998

| Lecturer | Topic |
| --- | --- |
| 1. Mr. Asoka Handagama | රූපවාහිනී මායාව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව |
| 2. Mr. N. Medelson | Books and technology: Partners in progress. |
| 3. Dr. Gamini Corea | Sri Lanka in a changing world |

## Book Exhibitions

Following book exhibitions were organized by the Sri Lanka National Library Services Board.

| | |
| --- | --- |
| 22 - 28 Sep. | Sri Lanka National Library Services Board. |
| 8 - 18 Sep. | Colombo Public Library |
| 10 - 12 Sep. | Public Library , Baddegama |

## Training Courses

Sri Lanka National Library Services Board conducted following training courses during July - September 1998.

| | |
| --- | --- |
| 4 - 5 July | Nuweraeliya District 85 trainees participated. |
| 13 - 14 july | Colombo education region. 44 trainees participated |
| 16 - 17 July | Biyagama education division. 30 trainees participated |
| 29 - 30 July | Hakmana education region. 85 trainees participated |
| 8 - 10 Aug. | Ibbagamuwa education region. 50 trainees participated |
| 12 - 14 Sep. | Matara education region. 69 trainees participated |
| 19 - 21 Sep. | Matale District 52 trainees participated. |
| 25 - 27 Sep. | Anuradhapura District 57 trainees participated |

Continued page 23

# ආචාර්ය එස්. ආර්. රංගනාදන් ජීවිතය සහ වෘත්තිය දයකත්වය


**ඩබ්. කේ. එම්. එම්. කේ. විරසිංහ**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය**
**කැළණිය විශ්ව විද්‍යාලය**


1892 දී ඉන්දියාවේ ග්‍රාමීය පෙදෙසක ෂ්‍යාලි රාමමෙත්ති රංගනාදන්ගේ උපත සිදුවිය. ඔහුගේ දෙමාපියන්ගේ ජීවනෝපාය මාර්ගය වූයේ කෘෂිකර්මාන්තයයි. රංගනාදන් කුඩාකලදී ම ඔහුගේ පියා මිය යාම ඔහු ලද අභාග්‍යසම්පන්න අත්දැකීමක් විය. එතැන් සිට විවිධ ආර්ථික දුෂ්කරතා මාධ්‍යයේ වුව ද ඔහුගේ මව වන සීතා ලක්ෂමී සිය පුතණුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීමට කිසිවිටෙකත් ඉඩ නුදුන්නා ය. එහි ප්‍රතිපලයක් ලෙස 1916 දී රංගනාදන් ගණිතය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියත් 1921 දී ගණිතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබා ගත්තේය.

1921 දී ඔහුගේ ජීවිතයේ ඉතාමත් වාසනාවන්ත සිදුවීමක් සිදුවිය. එනම්, මදුරාසියේ එක් විද්‍යාලයක ගණිතය පිළිබඳ සහාය මහචාර්යවරයකු ලෙස සේවය කිරීමේ භාග්‍යය ඔහුට උදාවීමයි. නමුත්, ටික කලක් ගත වන විට ඔහුට විවිධ ආර්ථික දුෂ්කරතා ඇතිවන්නට වූයෙන් ඔහු ඉන් ඉවත්විමට තීරණය කළේය. 1924 වසරේ දී ඉන්දියාවේ මදුරාසි විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සඳහා පුස්තකාලයාධිපති තනතුරට ඉල්ලුම්පතක් යොමු කළේය. එහිදී පවත්වනු ලැබූ සෑම පරීක්ෂණයකින්ම විශිෂ්ඨ ලෙස සමත් වූ මොහු 1924 ජනවාරි 04 වන දින මදුරාසි විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති ලෙස පත් විය. ඔහුගේ ජීවිතයේ මෙන් ම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේත් සුවිශේෂ ම වසර ලෙස 1924 වසර හඳුන්වා දිය හැකියි. ඊට හේතුව ඉතාමත් දක්ෂ ගණිතඥයෙකු පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයට එකතු වීමයි.

ඉතා කෙටි කලකින් ඔහුට එම පුස්තකාලයාධිපති තනතුර අමිහිරි අත්දැකීමක් බවට පත් විය. එයට හේතු ලෙස ඔහු පෙන්වා දුන්නේ, එම පුස්තකාලය අඳුරු ගුහාවක් බවය. එනම් එහි ඇති අසංවිධානාත් මකභාවය හා පාඨකයන්ගේ පැමිණීමේ දුර්වල තත්ත්වයයි. මෙවැනි දුෂ්කරතා නිසා ඔහු නැවතත් ඔහුගේ පැරණි විද්‍යාලය වෙත යාමට තීරණය කළේය.

## උසස් අධ්‍යාපනය

කෙසේවෙතත් 1924 දී පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ වැඩිපුර අධ්‍යාපනයක් ලබාදීම සඳහා රංගනාදන් එංගලන්තය වෙත යැවීමට මදුරාසි විශ්වවිද්‍යාලය තීරණය කරන ලදී.

එංගලන්තයේ දී ඔහුට පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රධාන පෙලේ ආචාර්යවරයෙකු වන ඩබ්. සී. බී. සෙයර්ස් හමුවීමට අවස්ථාව උදා විය. රංගනාදන් එංගලන්තයේ දී සිය අධ්‍යාපනය ආරම්භ කළේ මොහු යටතේය. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ "වර්ගීකරණය" යන විෂය පිළිබඳ ප්‍රමුඛ පෙලේ ආචාර්යවරයෙකු ලෙස මොහු හඳුන්වා දිය හැකිය.

මේ කාලය තුළ රංගනාදන්ගේ හිත තුළ එක්තරා දැවෙන ප්‍රශ්නයක් හටගෙන තිබුණි. එය නම් 1925 වර්ෂය වනතෙක් භාවිත කළ ඩිවි දශම වර්ගීකරණය තවදුරටත් භාවිත කරනවා ද, නැතහොත් නව වර්ගීකරණ ක්‍රමයක් හඳුන්වාදිය යුතු ද යන්නයි. නව වර්ගීකරණ ක්‍රමයක් පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයට හඳුන්වා දිය යුතුයි යන අදහස මත ඔහු කටයුතු කළේය. එක්දිනක් රංගනාදන් ලන්ඩනයේ වීදියක් දිගේ ගමන් කරමින් සිටින විට ඔහු කුඩා සෙල්ලම් භාණ්ඩයක් දිටීය. ඔහුට එහි සුවිශේෂත්වයක් විය. එනම්, සංස්ලේෂණය හා විශ්ලේෂණය පිළිබඳ ලක්ෂණයක් ඒතුළින් සොයා ගත හැකි වීමයි. කවදා හෝ දිනෙක නව වර්ගීකරණ ක්‍රමයක් සොයා ගැනීමේ දී මෙම සෙල්ලම් භාණ්ඩය පදනම් කර ගත හැකි යයි සිතූ ඔහු එය සිතෙහි ධාරණය කර ගත්තේය. එම අදහස ධාරණය කිරීමෙන් පසු රංගනාදන්

නව වර්ගීකරණ ක්‍රමයක් නිර්මාණය කළේය. නමුත් එංගලන්තයේ දී මෙම නව වර්ගීකරණ ක්‍රමය අත්හදා බැලිය නොහැකි විය. ඒ නිසා හැකි ඉක්මණින් ආපසු සිය රට බලා ඒමේ දැඩි ආශාවකින් ඔහු පෙලුණේය.

රංගනාදන් ලන්ඩනයේ සිට මදුරාසිය බලා ගමන් ගත්තේ "දුමානා" නම් නැවෙනි. ඔහු නැවෙහි ගමන් කළ කාලය තුළ එහි තිබූ පුස්තකාලයෙහි පොත් 3000ක් පමණ ඔහුගේ මෙම නව වර්ගීකරණ ක්‍රමය යටතේ වර්ගීකරණයට ලක් කරන ලදී. ඒ අනුව ඔහු විසින් සොයාගන්නා ලද දෙතිත් වර්ගීකරණ ක්‍රමය මුල් වරට ප්‍රයෝගික ව ක්‍රියාවට නැඟුනේ ජංගම පුස්තකාලයක් තුළ දීය.

1925 දී නව දර්ශනයක් සහිත පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ආචාර්යවරයෙකු වශයෙන් රංගනාදන් මදුරාසි විශ්ව විද්‍යාලය වෙත පැමිණියේය. ඔහු විසින් එංගලන්තයේ දී ඉගෙන ගන්නා ලද සෑම දෙයක් ම ප්‍රායෝගික ව අත්හදා බැලීමට මදුරාසි විශ්ව විද්‍යාලය තෝතැන්නක් විය. රංගනාදන්ගේ සමාජ විද්‍යාගාරය බවට පත් වූයේ එම විශ්වවිද්‍යාලයයි.

* පුස්තකාලය විවෘත කරන වේලාවන් දීර්ඝ කිරීම.
* විමර්ශන සේවය වර්ධනය කිරීම
* වසර තුළ පුස්තකලය වසා තබන දින ගණන හැකි පමණින් අඩු කිරීම

වැනි සංකල්ප රංගනාදන් පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයට එක් කළේ මෙහිදීය.

රංගනාදන් 1925 සිට 1945 දක්වා වසර 20ක පමණ කාලයක් මදුරාසි විශ්වවිද්‍යාලයෙහි සේවය කළේය. මෙම කාලය තුළ ඔහු එකදු අනියම් නිවාඩුවක් හෝ නොගැනීම විශේෂ ලක්ෂණයකි. ඔහුගේ විවාහ දිනයේ දී පවා සවස් වරුවෙහි පැය 2ක් පුස්තකාලයේ සේවය කරන ලද බව වාර්තා වේ. මෙම කාලය තුළ ඔහු විසින් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට ඉමහත් සේවයක් ඉටු කරන ලදී

1945 දී රංගනාදන්ගේ සිතට එක්තරා ගැටලුවක් මතු විය. එනම්, තවදුරටත් මදුරාසියේ සිට ඉන්දියාවට සිය අදහස් ලබා දෙනවා ද නැතිනම් තම ගමන් මග වෙනස් කළ යුතු ද යන්නයි. එසේ සිතූ ඔහු 1945 දී මදුරාසි පුස්තකාල්යෙන් විශ්‍රාම ගත්තේය. ඔහුගේ විශ්‍රාම ගැනීම පිළිබඳ ප්‍රවෘත්තිය දැනගත් විශ්ව විද්‍යාල උපකුලපතිවරු ඔවුන්ගේ විශ්වවිද්‍යාල වෙත පැමිණෙන ලෙස රංගනාදන්ට ආරාධනා කරන ලදී. මෙවන් එක් ආරාධනාවක් දිල්ලියේ උපකුලපතිගෙන් ලැබුණු අතර තවත් ආරාධනාවක් බරණැස හින්දු විශ්වවිද්‍යාලයේ උපකුලපති ගෙන් ලැබිණි. බරණැස විශ්වවිද්‍යාල උපකුලපති හා රංගනාදන් අතර ඇති පුද්ගලික සම්බන්ධතාව පිළිබඳව සලකා බලා එම විශ්වවිද්‍යාලයට යාමට ඔහු තීරණය කළේය. මේ අනුව ඔහු බරණැස පුස්තකාලයේ පුස්තකාලයාධිපති ලෙසින් පත් විය.

## බරණැස විශ්වවිද්‍යාලය

රංගනාදන් මදුරාසි විශ්ව විද්‍යාලය වෙනුවෙන් කරන ලද සේවයට වඩා වැඩි සේවයක් බරණැස විශ්වවිද්‍යාලය වෙනුවෙන් ඉටු කළේය. එහිදී ඔහු පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ නවතම සංකල්ප හඳුන්වා දුන්නේය. පුස්තකාල හා විඥාපන විද්‍යාව සම්බන්ධයෙන් අධ්‍යයන අංශයක් ඇති කළේය. ඒ සඳහා විවිධ පාඨමාලා ආරම්භ කළේය. දිනපතා උදෑසන 6.00ට විශ්වවිද්‍යාලයට ඇතුළු වූ රංගනාදන් රාත්‍රී 10.00 පමණ වනතුරු එහි සේවය කළේය. එම විශ්වවිද්‍යාලයෙහි මේ ආකාරයෙන් සේවය කළ එකම තැනැත්තා රංගනාදන්ය. අවංකව ම සේවයට කැප වී කටයුතු කරන මෙවන් තැනැත්තන් වෙත විවිධ බාධක ගැටලු පැමිණීම ස්වභාවිකය. පුස්තකාලයෙහි සේවක පිරිස රංගනාදන්ට විරුද්ධව විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කර තිබිණ ඊට හේතුව වූයේ රංගනාදන් සමග වැඩ කිරීමට මෙම සේවකයන් අසමත් වීමයි. රංගනාදන් එතරම් වේගයෙන් වැඩ කටයුතු කළ කෙනෙකි. එක් දිනක සියලුම සේවකයෝ විරෝධ පාඨ පවසමින් ඔවුන්ගේ විරෝධතා ව්‍යාපාරය පවත්වන්නට විය. තමාගේ ශ්‍රමයෙන් ගොඩනගා ගත් පුස්තකාලය තමාට විරුද්ධ වීම පිළිබඳ රංගනාදන් දුක් වුනේය. 1947 දී එක්තරා දිනයක උදෑසන රංගනාදන් පුස්තකාලයට යනවා වෙනුවට උපකුලපතිවරයා වෙත ගොස් සිය ඉල්ලා අස්වීම භාරදීමට තීරණය කළේය. ඒ වන විට උපකුලපතිවරයා විදේශගත වී සිටි බැවින් ඔහුගේ ලේකම් වෙත එම ලිපිය භාරදුන් රංගනාදන් බරණැස විශ්වවිද්‍යාලයෙන් පිටත් වූයේ නැවතත් ඒ වෙත නොඑමියි යන සිතුවිල්ලත් සමඟය.

රංගනාදන් බරණැස විශ්ව විද්‍යාලයෙන් ඉවත්වනවාත් සමඟ ම දිල්ලි විශ්වවිද්‍යාලයෙන් ඔහු වෙත ආරාධනාවක් ලැබිණි. ඒ අනුව ඔහු දිල්ලි විශ්වවිද්‍යාලය වෙත යාමට තීරණය කළේය. එම විශ්ව විද්‍යාලයෙහි එවකට සිටි පුස්තකාල යාධිපති. වන දාස් මෙත්තා රංගනාදන්ගේ ශිෂ්‍යයෙකි. එබැවින් රංගනාදන් එම පුස්තකාලයෙහි පුස්තකාලයාධිපති තනතුර භාර ගැනීමට අකමැති විය. ඒ අනුව ඔහු පර්යේෂණ මහාචාර්යවරයෙකු ලෙස දිල්ලි විශ්වවිද්‍යාලයෙහි සේවය කිරීමට තීරණය කළේය. 1947 දී දිල්ලි විශ්වවිද්‍යාලයෙහි පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයක් පිහිටුවීමෙන් පොදුරාජ්‍ය මණ්ඩලීය රටක ප්‍රථම වරට පුස්තකාල විද්‍යාව

පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවක් ආරම්භ කිරීමේ ගෞරවය හිමිවන්නේ එස්. ආර්. රංගනාදන්ටය. එපමණක් නොව සිය සේවය විශ්වවිද්‍යාලයෙන් පිටතට ද ගෙනයාමට සිතූ රංගනාදන් පුස්තකාලයෙහි නිවාඩු ඇති සෑමවිට ම පුස්තකාල සේවය වෙනුවෙන් විවිධ වැඩසටහන් සම්පාදනය කළේය.

ඉන් එක් වැඩසටහනක් නම් පුස්තකාල විද්‍යාව පිළිබඳ සංවාද පැවැත්වීමයි. 1950 දී මෙම වැඩසටහන ආරම්භ විය. ඉන්දියාවේ හිටපු පුස්තකාලවේදීන් සමග පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සෑම නිවාඩු දිනක ම සවස 2න් පසු මෙම සංවාද පැවැත්විණි සෑම ඉරිදා දිනක ම පැදුරු මත වාඩි වූ ඔවුහු රංගනාදන් විසින් හඳුන්වා දෙන ලද පංචවිධ සංකල්පය පිළිබඳ මෙන් ම වර්ගීකරණ හා සූචිකරණ නීතිරීති පිළිබඳව ද සාකච්ඡා කළහ. මෙය ඔහුගේ නිවසේ ආරම්භ කළ පර්යේෂණ කවයකි.

මේ ආකාරයෙන් පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය වෙත විශාල මෙහෙයක් ඉටුකරමින් සිටි රංගනාදන් හට විවිධ ගැටලුවලට මුහුණදීමට සිදු විය. ඊට එක් හේතුවක් වූයේ මේ පුද්ගලයා සෑම තැනකදී ම ඉදිරියට ම ගමන් කිරීමයි.

1950 දශකයෙහි ජාත්‍යන්තර පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයෙහි රංගනාදන් නැතිව ම බැරි පුද්ගලයෙක් විය. FID - IFLA වැනි සංවිධානවල සැසිවාර පැවැත්වෙන සෑම අවස්ථාවක ම රංගනාදන් වෙනුවෙන් ආසනයක් වෙන් වී තිබිණි. පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය තුළ සෑම කෙනෙක් ම ඔහුට ගරුබුහුමන් දැක්වීය. ඔහුගේ ප්‍රවීනත ම ශිෂ්‍යයකු වන මහාචාර්ය බවුලා පවසන පරිදි රංගනාදන් මේ සෑම ජාත්‍යන්තර සමුළුවකට ම සහභාගී වූයේ ඉන්දියානු ජාතික ඇඳුමිනි. එසේම ඔහු යන සෑම තැන ම ඔහු රැගෙන ගිය කෘති දෙකක් විය. එනම්, භගවත් ගීතාව හා රාමායනයයි. ඇමරිකා එක්සත් ජනපද කොන්ග්‍රස් පුස්තකාලයේ සම්මන්ත්‍රණයක් සඳහා සහභාගී වුව ද, ඒ සඳහා පිටත් වීමට පෙර දින අනිවාර්යයෙන් ම ඔහු රාමායනය කියවූයේය. රංගනාදන් එතරම් ආගමට ලැදි පුද්ගලයෙකි. ඔහු ජාත්‍යන්තරව මෙතරම් ප්‍රසිද්ධියට පත් වූයේත් ඔහු දැඩි ආගමික ශික්ෂණයකින් කටයුතු කළ නිසා බව සමහරුන්ගේ අදහසයි.

## සර්දා රංගනාදන් පදනම

රංගනාදන්ගේ ජීවිතයෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ තවත් එක් කරුණක් වූයේ ඔහුගේ බිරිඳ වන සර්දා රංගනාදන්ය. ඇය ඔහුගේ සෙවනැල්ල සේ පසුපසින් සිටියාය. ඇය නොසිටින්නට රංගනාදන් කෙනෙකු පුස්තකාල ක්ෂේත්‍රයෙහි බිහි නොවන්නට ඉඩ තිබිණ. රංගනාදන් මදුරාසියෙහි ජීවත්වන කාලයෙහි ඔහුගේ නිවසෙහි කිසි ම ගෘහභාණ්ඩයක් නොතිබිණ. පැමිණෙන අමුත්තන් හට වාඩිවීමට සිදු වූයේ ගෙබිමය. මේ හේතුව මත ඔහුට විරුද්ධව ව්‍යාපාර ද ඇතිවෙන්නට විය. විදේශ රටවලින් ඉන්දියාවට පැමිණෙන මහාචාර්ය වරුන්ටත් මේ අයුරින් බිම හිඳ ගැනීමට සිදුවීම නිසා ඔවුන් ඉන්දියාව පිළිබඳ වැරදි අවබෝධයක් ලබාගන්නේ යැයි ඇතැම් අය රංගනාදන්ට චෝදනා එල්ල කළහ. නමුත් රංගනාදන් ඉතාමත් චාම් අයුරින් ඔහුගේ ජීවිතය ගෙව්වේය. මේ අයුරින් ඔහු මුදල් ඉතිරි කළේය. 1924 සිට ඔහුගේ වැටුපෙන් කිසියම් මුදලක් ඉතිරි කර ගත්තේය. එම මුදල් ඔහුගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා නොව පුස්තකාල සේවාවේ දියුණුව සඳහා යෙදවූයේය. 1957 දී මදුරාසි විශ්වවිද්‍යාලයේ දී පුස්තකාලය හා විඥාපන විද්‍යාව ක්ෂේත්‍රය සම්බන්ධ පදනමක් බිහි කළේය. ඇමරිකා එක්සත් ජනපදයෙන් බාහිර ව ලෝකයේ ප්‍රථමවරට පුස්තකාල හා විඥාපන විද්‍යාව සම්බන්ධයෙන් පදනමක් ආරම්භ කරන ලද්දේ රංගනාදන් විසිනි. 1924 සිට ඔහු විසින් ඉතිරි කරන ලද මුදලින් ඉන්දීය රුපියල් ලක්ෂයක මුදලක් ඔහු මෙම පදනම සඳහා පරිත්‍යාග කළේය. මෙම පදනම බිහි කිරීමෙන් ඔහු බලාපොරොත්තු වූයේ පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයෙහි දියුණුවයි. මේ අවස්ථාවට සහභාගී වූ ඔහුගේ ප්‍රවීනතම ශිෂ්‍යයකු වන ආචාර්ය ජී. බවුලා විසින් රංගනාදන්ගේ බිරිඳ වෙත මෙසේ පවසන ලදී. එනම්, ඔබ දෙදෙනා දැන් විවාහකයි. ඔබ දෙදෙනාට යෝගේෂ්වරන් නම් දරුවෙකු සිටියි. ඔහු තවමත් අධ්‍යාපනය හදාරයි. කරුණාකර මෙම මුදල එම දරුවාගේ බැංකු ගිණුමට දමන්නයි. එවිට රංගනාදන්ගේ බිරිඳගේ පිළිතුරු වූයේ මෙයයි. "රංගනාදන් එක දරුවෙකුගේ පියෙකු නොවේ. ඔහුට දරුවන් දෙදෙනෙකු සිටියි. වැඩිමලා පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය, බාලයා යෝගේෂ්වරන්. අපි මේ පරිත්‍යාගය කළේ අපේ වැඩිමල් දරුවාටයි. ඒ නිසා කරුණාකර මෙම පදනම දියුණු කරන්න ආධාර කරන්න."

එදා සිට රංගනාදන් විසින් ලියන ලද සෑම ග්‍රන්ථයක් හා ලිපියක් ම එම පදනම වෙත බාර කරන ලදී. ඒ හැරුණු විට ඔහුගේ වැටුපෙන් කොටසක් ද ඔහු විසින් නොමසුරුව එයට බැර කරන ලදී. සර්දා රංගනාදන් පදනම මගින් ඔහු විවිධ දේ කළේය. එනම්, ඉන්දියාව පුරා ම පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේ දියුණුවට උදව් දීම, ශිෂ්‍යයන් හට ශිෂ්‍යත්ව ලබාදීම, විවිධ ලෙඩරෝගවලින් පෙළුණු ශිෂ්‍යයන් හට අවශ්‍ය ප්‍රතිකාර ලබාදීම, යනාදියයි. මෙලෙස

රංගනාදන් හැමවිට ම මනුෂ්‍යත්වය ප්‍රදර්ශනය කළ බැවින් ඔහුට ජාත්‍යන්තර කීර්තියක් අත් විය.

රංගනාදන්ගේ බිරිඳ සම්බන්ධයෙන් මෙහිදී තවත් එක් සිද්ධියක් විශේෂයෙන් සඳහන් කළ හැකිය. 1945 දී එක්තරා රැස්වීමක් බරණැස හින්දුවිශ්වවිද්‍යාලයේ දී පැවැත්විණි. මෙම රැස්වීමේ දී "විද්‍යාව හා ආගම" යනුවෙන් දේශනයක් පැවැත්වීම සඳහා රංගනාදන්ට ද ආරාධනාවක් ලැබිණ. ඔහු සුපුරුදු ලෙස සිය බිරිඳත් සමග එම රැස්වීමට සහභාගි වූයේය. රංගනාදන්ගේ කීර්තිමත් නාමයට හානි පැමිණවීම බලාපොරොත්තු වෙන් මහාචාර්යවරු කිහිපදෙනෙක් ම මෙම රැස්වීමට සහභාගී වී සිටියහ.

කුමන ආකාරයේ පැනයක් නැගුවත් රංගනාදන් පිළිතුරු දෙන බව දැනගත් එම පිරිස ඔහුගේ බිරිඳ පිළිබඳ ප්‍රශ්න ඇසීමෙන් ඔහුව අපකීර්තියට පත් කිරීමට උත්සාහ කළහ. රංගනාදන්ගෙ බිරිඳ දකුණු ඉන්දියාවේ උපන් කාන්තාවකි. ඇය හින්දි භාෂාව දැන සිටියේ නැත. ඇය දැනගෙන සිටියේ ද්‍රවිඩ භාෂාව පමණයි. ඒ බව දැනගත් මෙම මහාචාර්යවරු පිරිස "ඔබගේ බිරිඳ ජාත්‍යන්තර භාෂාවන් කීපයක් දන්නේ ද?" යනුවෙන් පැනයක් නැගූහ. ඊට රංගනාදන් දුන් පිළිතුර වූයේ "ඇයට අවශ්‍ය භාෂා සියල්ල ඇය දන්නවා" යනුවෙනි. එයින් නොනැවතුනු එක් මහාචාර්යවරයෙක් තවත් පැනයක් නැගුවේය. එනම් "ඔබගේ බිරිඳ සමත් වී තිබෙන උසස් ම විභාගය කුමක් ද ? යන්නයි." පතිව්‍රතාව නම් විභාගය ඇය ඉතා උසස් ලෙස සමත් වී ඇත" යනු රංගනාදන්ගේ පිළිතුර විය. එසේම ඇයට සමත් වීමට වෙනත් විභාග අවශ්‍ය නොවන බව ද ඔහු පෙන්වා දුන්නේය. මේ ආකාරයෙන් ඕනෑ ම පැනයකට අවශ්‍ය නිවැරදි පිළිතුරු දීමේ හැකියාවක් ඔහු වෙත විය.

1950 දශකයේ ඉන්දියාව තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන ආයතන රැසක් ආරම්භ කිරීමට රංගනාදන් සමත් විය. ඔහුගේ එක ම පුතා එවකට ස්විට්සර් ලන්තයෙහි පදිංචිව සිටියේය. "කරුණාකර ඇවිත් මා සමග රැඳෙන්නෙ" යනුවෙන් ඔහු නිතර ම රංගනාදන්ගෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව 1955 දී රංගනාදන් ස්විට්සර්ලන්තය බලා පිටත් විය. 1957 වනතෙක් ඔහු එහි ජීවත් විය. මෙම කාලය පිළිබඳ මහාචාර්ය ක්‍රිෂාන් කුමාර් හඳුන්වන්නේ පුස්තකාල විද්‍යාවේ හදවත නැවතුන වසර දෙකක් ලෙසටයි.

රංගනාදන් ස්විට්සර්ලන්තයේ ජීවත් වූ කාලයේ දී නැවතත් ඉන්දියාවට පැමිණ පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයට නායකත්වය ලබාදෙන ලෙස දස දෙසින් ඔහු වෙත ආරාධනා ගලා එන්නට විය. මේ අනුව ඔහු යළිත් බැංගලෝරය වෙත පැමිණීමට තීරණය කළේය. එසේ පැමිණ නැවතත් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට දායකත්වය දුන්නේය.

## පංචවිධ නීති

ආචාර්ය රංගනාදන් විසින් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වෙත ලබාදෙන ලද දායකත්වය දෙස බැලීමේ දී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ ඔහු විසින් පුස්තකාල ලෝකයට හඳුන්වා දෙන ලද පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ නීති පහයි. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය නම් තිවස ඔසවාගෙන සිටින ටැම් 5ක් ලෙස මෙම නීති 5 හැඳින්වේ. ඒ වනතෙක් පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය වෙත විද්‍යාත්මක පදනමක් ආරෝපනය වී නොතිබිණ. 1928 දී මද්‍රාසියේ පැවති විශේෂ උත්සවයක දී ඔහු පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ මෙම නීති 05 ප්‍රකාශයට පත් කරමින් පුස්තකාල ක්ෂේත්‍රය වෙත විද්‍යාත්මක පදනමක් ආරෝපනය කළේය.

මෙම නීති 05 පිළිබඳ සැලකීමේදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ මුල් වරට රංගනාදන් විසින් හඳුන්වා දෙන ලද්දේ නීති 04ක් පමණක් බවය.

1. සෑම පාඨකයෙකුට ම පොතක් තිබිය යුතුය.
2. සෑම පොතකට ම පාඨකයෙකු සිටිය යුතුය.
3. පාඨකයාගේ කාලය ආරක්‍ෂා කළ යුතුය.
4. පුස්තකාලය වැඩෙන සංස්ථාවකි.

මෙම නීති සතර ප්‍රකාශයට පත් කළ ද එහි කුමක් හෝ අඩුපාඩුවක් පෙනෙන්නට ඇති බව බී රෝස් නම් ගණිතඥයා සමග රංගනාදන් පැවසුවේය. මේ සම්බන්ධයෙන් ඔවුන් නිරන්තරයෙන් සාකච්ඡා කළහ. අවසානයේ මෙයට තවත් එක් නීතියක් එක්විය යුතු යයි රංගනාදන් තීරණය කළේය. එය නම් " සියලුම පොත් පවතින්නේ භාවිතය උදෙසාය " යන්නයි. 1931 දී මේ ආකාරයෙන්, නීති 05ක් ප්‍රකාශයට පත් විය. මෙහිදී විශේෂයෙන් දැක්විය යුත්තේ මැටි පුවරුවේ සිට පරිගණකය දක්වා පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය වෙනස් වුව ද මෙම නීති 05 ඕනෑම යුගයකට අදළ කරගත හැකි වීමයි. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයෙහි ඕනෑම දෙයක් මෙම නීති 5 මත රඳා පවතිනවා යයි කිව හොත් නිවැරදිය. මෙය රංගනාදන්ගෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට ලැබුණු ඉහළ ම දායාදය ලෙස හැඳින්විය හැකිය.

## දෙතිත් වර්ගීකරණය

1931 දී ප්‍රථම වරට "The Five Laws of Library

Science" යන ග්‍රන්ථය ලොවට දායාද කළේය. අද වුවත්, මෙම නීති 5 පුස්තකාල හා විඥාපන විද්‍යාවේදීන්ගේ දෙතොල රැව්දෙන සිද්ධාන්ත බවට පත් වී ඇත. රංගනාදන් විසින් පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය වෙත ලබා දුන් දෙවන දායාදය වන්නේ දෙතිත් වර්ගීකරණයයි. ඒ අනුව 1933 දී ලොව ප්‍රථම වරට න්‍යායයක් මත පදනම් වූ වර්ගීකරණ ක්‍රමයක් ඉදිරිපත් කිරීමේ ගෞරවය ඔහුට හිමි වේ. එතෙක් කල් ලොව පැවති ඩිවි දශම වර්ගීකරණ ක්‍රමයට වඩා හාත්පසින් වෙනස් වර්ගීකරණ ක්‍රමයක් ලෙස දෙතිත් වර්ගීකරණ ක්‍රමය හැඳින්විය හැකිය. මෙහිදී ඔහු වර්ගීකරණ ක්‍රමය පමණක් නොව එයට අවශ්‍ය න්‍යායාත්මක පසුබිමත් ඉදිරිපත් කළේය. වාර්ගීකෘත සූචි පත්‍රිකා' Classified catalogue card) යන අදහස මුල්වරට ලොවට හඳුන්වා දෙන ලද්දේ රංගනාදන් විසිනි. ඒ හැරුණු විට දාම අනුක්‍රමණිකා ක්‍රමය යන අදහස මුල්වරට ලොවට ඉදිරිපත් කළේ ද රංගනාදන්ය. පුස්තකාල කළමනාකරණය පිළිබඳ ඔහු නව ආකල්ප ඉදිරිපත් කළේය.

## සාකච්ඡා

රංගනාදන් විසින් පුස්තකාල හ විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වෙත දක්වන ලද මෙම දායකත්වය පිළිබඳ බටහිර ලෝකය විමතිය පළ කළේය. එතෙක් කල් බටහිර ගැති ආකල්පයන්ගෙන් සමන්විත වූ පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය පෙරදිගට උරුම කරලීමේ සටන ආරම්භ කරන ලද්දේ රංගනාදන් විසිනි. රංගනාදන් යන යන තැන ඔහුට පුටුවක් ලැබුනේ ඒ නිසාය. බටහිර හා නැගෙනහිර සම්බන්ධ කළ එකම පුස්තකාලවේදියා ඔහුය. රංගනාදන්ගේ ජීවිතයේ තිබූ විශේෂතම ලක්ෂණය නම් සෑම වේලාවක ම ඔහු අලුත් දෙයක් ලොවට ඉදිරිපත් කිරීමය. ඉන් එක් දෙයක් නම් දිල්ලියේ ඔහුගේ නිවසේ අධ්‍යයන කවයක් ආරම්භ කර සාකච්ඡා කිරීමයි. ඊට අමතරව ඔහුගේ එක් ප්‍රධාන ම විනෝදාංශයක් වූයේ දිනපතා උදෑසන සැතපුම් 2ක් පමණ මුහුදු වෙරළ දිගේ ඇවිද යාමයි. මෙසේ ඇවිදීම සඳහා විවිධ පුස්තකාලවේදීන් වෙත ඔහු අරාධනා කළේය. මුහුදු වෙරළෙහි ඇවිදින අතර ඔහු ඒ අයත් සමග පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ අලුත් න්‍යායයන් ඉදිරිපත් කළේය. අලුත් දර්ශන ඉදිරිපත් කළේය. ඉන්දියාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයෙහි සංවර්ධන සැලසුම පිළිබඳ සාකච්ඡා කළේය. ජාත්‍යන්තර සම්මේලන පිළිබඳ සාකච්ඡා කළේය. මේ ආකාරයෙන් ඔහුගේ සෑම කාල වේලාවක් ම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයෙහි දියුණුව වෙනුවෙන් වැය කළේය.

ඔහුගේ ජීවිතයේ අවසාන කාලයේ ඔහු broncities (බ්‍රොන්කයිටිස්) නම් රෝගයකින් පෙලුනේය. අවසාන අවුරුදු 4 තුළ ඔහු ඉතා දරුණු ලෙස රෝගාතුර විය. වෛද්‍යවරු පැවසුයේ රංගනාදන් ඉතා අධික ලෙස වැඩ කිරීම මෙම රෝගය උත්සන්න වීමට හේතු වූ බවයි. එබැවින් එම සියලු කටයුතුවලින් ඉවත් වී විවේක ගන්නා ලෙස වෛද්‍යවරුන් විසින් අවවාද කරන ලදී. නමුත් මේ කිසිම උපදෙසක් රංගනාදන් පිළිගත්තේ නැත. ඔහු ලෙඩ ඇඳේ සිට බැංගලෝරයේ මහජන පුස්තකාල පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය. එම සම්මන්ත්‍රණය පවත්වා දින කිහිපයකින් රංගනාදන් ගේ අවසානය ද සිදු විය. ඔහු මියයන තෙක් ම පැවසුවේ ' මා හට දැන් ලියන්න කියන්න අපහසුයි. නමුත් ඕනෑම කෙනෙකුට පුස්තකාල විද්‍යාව පිළිබඳ මා සමග සාකච්ඡා කළ හැකියි. ඒ සඳහා මගේ නිවසේ දොරගුලු හැර තිබේ ' යනුවෙනි. ඔහු සෑම විට ම පුවත්පත් හා සඟරා වාර්තාකරුවන් වෙත ආරාධනා කළේය. ඉන් ඔහු බලාපොරොත්තු වූයේ ඔහුගේ අදහස් හැකිතරම් ප්‍රචාරය කිරීමයි. රංගනාදන් ඔහුගේ ජීවිතය පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් කැප කළේය.

## විමර්ශන සේවය

රංගනාදන් විසින් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වෙත දායද කර දෙන ලද තවත් විශේෂ දෙයක් තිබිනි. එනම් **විමර්ශන පුස්තකාල සේවය** පිළිබඳ නව අර්ථකතනයක් ලබාදීමයි. මේ සම්බන්ධයෙන් රංගනාදන් අදහස් දක්වන තුරු අදහස් දක්වා තිබුණේ බටහිර පුස්තකාලයාධිපතිවරු පමණි. විමර්ශන සේවයේ පියා ලෙස සලකන ලද්දේ **විලියම් ග්‍රීන් ය.** නමුත් රංගනාදන් පවසන ආකාරයට මෙම බටහිර දර්ශනය දෝෂ සහගතය. ඔහු විමර්ශන සේවය පිළිබඳ නවතම අදහස් දක්වමින් "The Reference Service" නම් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළේ ය. මෙම ග්‍රන්ථයෙහි ඔහු විමර්ශන සේවය කොටස් 2ට බෙදා දක්වා ඇත.

1. ප්‍රස්තුත විමර්ශන සේවාව.
2. සාධිකාරී විමර්ශන සේවය.

රංගනාදන් විසින් මදුරාසි විශ්වවිද්‍යාලය, බරණැස විශ්වවිද්‍යාලය හා දිල්ලි විශ්වවිද්‍යාලය වැනි ස්ථානවල පූර්ණකාලීන නව පුස්තකාලයාධිපති තනතුරු ඇති කිරීමට කටයුතු කරන ලදී. පුස්තකාලයාධිපතිවරු වෙත නිතර ම පැවසුවේ ජනතාව අතරට ගොස් ඔවුනට අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුයි යනුවෙනි. ඊට හේතුව නිදහසෙන් පසු ඉන්දියාවේ ජනතාව එළඹෙන යුගය පිළිබඳව දැනුවත් විය යුතු බව

රංගනාදන් ඇදගු බැවිනි. ඉන්දියාව පුරා ම ඔහුගේ අදහස් ප්‍රචාරය කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කළේය.

පසුකාලීනව රංගනාදන්ගේ දර්ශනය යම් තාක් දුරකට පසුබෑමකට ලක් වූ බව පෙනේ. ඊට හේතු වශයෙන් විද්වතුන් විසින් කරුණු කිහිපයක් පෙන්වා දී ඇත. ඉන් එකක් නම්, රංගනාදන් බටහිර රටක උපත නොලැබීමය. දෙවන කරුණ නම් රංගනාදන් භාවිත කළ ඉංග්‍රීසි භාෂාවයි. එංගලන්තයේ සිටින පුස්තකාලවේදීන්ට පවා තෝරා ගැනීමට අපහසු භාෂාවක් රංගනාදන් සමහර ග්‍රන්ථ ලිවීමටත් දේශන සඳහාත් යොදාගත් බව සේයස් පවසයි.

මේ අවස්ථාවේ දී ලොව සුප්‍රසිද්ධ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ආදි කර්තෘන් කිහිප දෙනෙකු පිළිබඳව ද සංසන්දනාත්ම කව විමසීමක් කිරීම සුදුසුය. දැනට බටහිර ලොව පුස්තකාල හ විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පියා ලෙස ඇතමෙක් සලකන්නේ මෙල්විල් ඩිවිය. ඔහු වර්ගීකරණයේ පියා ලෙස ද සැලකේ. 1876 දී වර්ගීකරණ ක්‍රමයක් හඳුන්වාදීම තුළින් ඔහු පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට එක් විය. ඊට අමතරව ඇමරිකා පුස්තකාල සංගමය බිහි කිරීමට ද මෙල්විල් ඩිවි මුල් වූයේය. 1888 ලොව ප්‍රථම පුස්තකාල හා විඥාපන විද්‍යා පාසල කොලොම්බියාවල ඇති කිරීමෙන් පුස්තකාල විද්‍යා අධ්‍යාපනයේ නිර්මාතෘවරයෙකු විය. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ "Library Journal" නම් සඟරාව ද ඔහු විසින් ආරම්භ කරන ලදී. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයෙහි තවත් ප්‍රවීනයෙකි ඩබ්. සී. ඩී. සේයර්ස්. වර්ගීකරණය සම්බන්ධයෙන් ඔහු ඉතා ශක්තිමත් න්‍යායාත්මක පදනමක් ලොවට බිහි කළේය. චාර්ල්ස් එමිකටර් විසින් ප්‍රථම වරට අකාරාදී සූචියක් පිළිබඳ නීති ඉදිරිපත් කරන ලදී. විස්තාරණීය වර්ගීකරණය ලොවට හඳුන්වා දීමේ ගෞරවය ඔහුට හිමි වේ. බ්‍රවුන් විසින් "Subject Classification" නම් වර්ගීකරණය ඉදිරිපත් කරන ලදී.

## රචිත කෘති

මොවුන් අතරින් රංගනාදන්ගේ දායකත්වය පිළිබඳ සලකා බලන විට එහි විශේෂත්වයක් දක්නට ලැබේ. එයට හේතුව, ඔහු සිය ජීවිත කාලය තුළ දී පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් රචනා කරන ලද පොත් සංඛ්‍යාවයි. පුස්තකාල හා විඥාපන විද්‍යා ග්‍රන්ථ 60 ක් ඔහු අතින් රචනා වී ඇත. පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ලිය වී ඇති සම්භාව්‍ය ග්‍රන්ථයන්ගෙන් රැසක් රංගනාදන් විසින් රචනා කරන ලද ඒවාය. ඔහුගේ කෘති රචනා කොට ලබාගත් මුදල් සර්දා රංගනාදන් පදනමට යොමු කළේය. අදත් රංගනාදන්ගේ පදනමෙන් ප්‍රකාශයට පත් කරනු ලබන පොත්පත්වල අරමුදල් වෙන් කරන්නේ මෙම පදනම උදෙසාය. මීට අමතරව පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය වෙනුවෙන් ඔහු විසින් රචිත වාර සඟරා ලිපි ප්‍රමාණය 2000ට අධිකයි. රංගනාදන්ගේ ප්‍රවීනත ම ශිෂ්‍යයා වන ආචාරිය පී.එන්. බවුලා පවසන ආකාරයට රංගනාදන් ඇදහිය නොහැකි අපූරු චරිතයකි. ඔහුගේ සේවය ඉන්දියාවට පමණක් සීමා වූයේ නැත. ඔහු ලොව දස දෙස ම සංචාරය කළේය. එම සෑම ස්ථානයක ම දේශන පැවැත්වූයේය. ඉන්දියාව පුරා ම පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලා ආරම්භ කළේය. මෙම සෑම දෙයක් වෙනුවෙන් ම ඔහු වෙත සම්මාන ගලා ආවේය. නමුත්, ඒ එකදු සම්මානයකින්වත් ඔහු උදම් වූයේ නැත. ඔහු හැමවිට ම පැවසුවේ මේ සෑම දෙයක් ම ඔහුගේ සේවය වෙනුවෙන් දෙවියන් වහන්සේ ලබා දෙන දායාදයන් බවය. ඒ නිසා මෙම ක්ෂේත්‍රයට මගේ සේවය මා ලබාදෙනවා යනුවෙනි.

## සම්මාන


පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් රංගනාදන් විසින් ඉටු කරන ලද සේවය වෙනුවෙන් විවිධ සම්මාන හා තනතුරුවලින් ඔහු පිදුම් ලැබීය. 1948 දිල්ලි විශ්ව විද්‍යාලය මගින් සාහිත්‍යශූරී උපාධියත්, 1957 දී ඉන්දීය රජය විසින් පද්ම ශ්‍රී සම්මානයත්, පිරිනමන ලදී. ඒ අතර,1965 ජාතික පර්යේෂණ මහාචාර්ය පදවියත්, 1971 දී විශේෂ කීර්ති නාමය ද ඔහු වෙත පුදන ලදී.

අද වන විට ඉන්දියාව පුරා පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන පාඨමාලා හැදෑරිය හැකි විශ්වවිද්‍යාල 49කට ආසන්න ප්‍රමාණයක් පැතිර ඇත. මුළු ඉන්දියාව පුරා ම ව්‍යාප්ත වූ ශිෂ්‍ය පරම්පරාවක් බිහි කිරීමේ ගෞරවය රංගනාදන්ට හිමි වේ. 1947 ඉන්දියාව නිදහස ලැබූ වර්ෂයේදී ම රංගනාදන් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවක් ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රපති පාඨමාලාව ආරම්භ වූයේ 1993 දීය. ඉන්දියාව ඉතා ආසන්න රටක් වුව ද රංගනාදන්ගේ ආභාෂය ලංකාවට නොලැබීම පුදුමයට කරුණකි. නැගෙනහිර යුරෝපයේ සමාජවාදී රටවල් පවා ඔහුව දේවත්වයෙන් සැලකූහ. විශේෂයෙන් සෝවියට් රුසියාවේ පැවති සෑම පුස්තකාල විද්‍යා සම්මන්ත්‍රණයකට ම රංගනාදන් ආරාධනා ලැබුවේය.


1972 වර්ෂයේ දී බැංගලෝර යේ දී ඔහු අවසන් හුස්ම හෙලුවේය. ඉන්දියාවට පමණක් නොව මුළු පිලොවට ම පුස්තකාල හා විඥාපන

(22 පිටුවට)


# DIRECTORIES
## published by the
## NATIONAL LIBRARY OF SRI LANKA





Rs. 100.00




Rs. 100.00




Rs. 225.00




Rs. 200.00




Rs. 100.00

**Inquiries**
**National Library Bookshop**
**14, Independence Avenue, Colombo 07.**

# Locating U.S Government Information on the World Wide Web

**Steven Kerchoff**
**ALA/USIS Library fellow**
**Sri Lanka National Library Services Board**

Imagine having quick, inexpensive access to thousands of publications in a host of disciplines -- medicine and health, education, foreign affairs and international relations, agiculture, immigration, economics and trade, and legislation. By using the World Wide Web, librarians and library users can access the wealth of information published by United States government agencies, information which is timely accurate, and authoritative. Accessing US government information via the internet insures the timeliness of the information. One need not wait weeks or months for a print publication to travel halfway around the globe. Electornic publications are avilable promptly, often within a few minutes of the document's public release.

Even in the U.S., few libraries could acquire and process every U.S. government publication. The Web, however, enables any library anywhere in the world to access these resources. No longer is the library by the collections held within its four walls. Today's library still provides traditional access to its local holding, but supplements this service with electronic access to information at remote sites. There are hundreds of thousands of U. S government pages on the World Wide Web. This proliferation of Web pages has rendered it impossible for one individual to keep track of every site. Several Web sites, however, offer " one - stop shopping " for Fedaral governmant information, convenient starting points for Web navigation. Rather than try to lean dozens or hundreds or thousands of sites, the user need only become familiar with a few good navigational tools. This article describes six of the most useful starting points for locating U.S. government information on the World Wide Web.

## Government Printing Office

Http:// www. access/ gpo. gov/ su-docs/ index. html.

The Government Printing Office prints, binds, and distributes the publications of the Congress as well as the executive departments and establish ments of the Federal Government. Although traditionally GPO has published in print and on microform. it is making increasing use of electronic media, including the World Wide Web and CD - ROM. GPO also administers the Depository Library program me through which selected Government publications are made available in libraries throughout the US.

GPO Access is a service of the U.S. Government Printing Office that provides free electronic access to a wealth of important information produced by the Federal Government.

The information provided on this site is the official, published version. The information retrieved from GPO Access can be used without restriction, unless specifically noted. GPO access provides searchable access to many key Federal documents, including the congressional Record, Congressional Bills, the Federal Register, the code of Federal Regulations, the Budget of the U.S. Code, Congressional Director, the U.S. code, Government Manual, and the U.S. constitution. It also provides introductory information for users who may be unfamiliar with these publications. GPO Pathway Services provides a suite of tools for locating Federal government information on the Web. A team of librarians studied the information - seeking patterns of library users, and designed the system according to those patterns. The service indexes Federal government Web sites which have been carefully selected for their content value. Pathway Services allows users to search for government publications by subject and by title, to search the subject and by title, to search the monthly catalog of US Government publications, and also to perform keyword searches on selected Web sites. University of California GPO Gate http:// www. gpo. ucop. edu/

Some newer users may encounter some difficulty in searching GPO access databases. The University of California GPO Gate offers a more user - friendly gateway interface to the same databases available via GPO Access. This gateway provides easier access to the same authoritative, timely data found on GPO Acces.

GPO Gate features enhanced search capabilities for searching the Code of Federal Regulations, which is the codification of the regulat ions issued by various executive depart ments and agencies. Users can search the CFR by title number, part number and page number, and can combine these elements with a keyword search.

## Federal Web. Locator.

http:// www. law. vill. edu/ Fed - Agency/ fedwebloc. html.

Sometimes the best starting point for locating US government information is a non - government Web site. An excellent cose in point is the Federal Web Locator which is maintained by the Villanova center for Information Law and Policy, at Villanova University in Pennsylvania.

The Federal Web Locator is intended to be the "one - stop shopping" point for Federal government information on the Web. This site provides links to a nearly comprehensive listing of Federal Web sites. Nearly any agency's Web site can be located by starting with this site. The Locator also allows users to search for sites by agency name.

## Government Information Xchange (GIX)

http:// www. info. gov.

Launched by the General Services Admisitrat ion's Federal Telecommuni cations Service, Office of Network Applications, GIX features links to Federal directory and yellow pages information, state, local and foreign government informa tion, international organiza tions, and intergov ernmental collaboration.

A complex set of regulations governs purchasing within the US Federal government. Federal employees responsible for purchasing a variety of materials will find the "Electronic Shopping Networks" sect ion, with its links to electronic Federal and commercial acquisitions sources, of particular interest.

## GovBot Database of Government Web sites

http:// cobar.cs. umass. edu/ ciirdemo / Govbot/ indexl. html

Many Internet users begin their search process by using one of the Internet search engines, such as Alta Vista, Excite, Hotbot, or Magellan. These engines retrieve Web pages indis criminiately, and often the user wastes time viewing irrelevant search results. One search engine, however, searches exclusive ly for government informa tion in the. gov and mil domains -- the GovBot.

Internet addresses routinely end in a three - letter code known as the domain, like edu. for educational instituions, com. for commercial organizations, and gov. for government agencies, (In fact, the domain is followed by a country code, like lk for Sri Lanka or US for the United States). Most Internet search engines will search for Web sites in any of the domains. The GovBot, however only search in the two domains where the user is most likely to find government information.

The GovBot server has gathered information from over 459,000. gov. (government) and mil (military) Web sites, and allows the user to search exclusively within those two domations.

The GovBot will not locate all Federel Web pages. Some federal agencies, such as the Smithsonian Institution and United States Military Academy, fall within the edu domain. Other Federal information is mounted on com servers in the commercial domain.

Because the GovBot searches directly for keywords , the user does not need to know where a paticular bureau or program or office fits within the government administra tive structue. For example, a user can search the GovBot and find the US Customs Service even without knowing that USCS is part of the Treasury Department, or find the General Accounting Office without knowing that GAO is part of the Legislative Branch. When searching for US government acronyms, the GovBot can be used to locate Web pages even when the user does not know the meaning of the acronym.


## Yahoo (Government section)

http:// www. yahoo. com/ Government/

Yahoo is one of several commercial sites which provide indexing for the Web. To use this "subject tree" the user choose from a menu of broad subject and further sub - divided with increasing specificity. Yahoo can be used to locate Web sites on almost for both Internet novices and experienced users. Yahoo provides a useful starting point not only for US government information, but also for foreign governments, embassies and consulates, interna tional organinzations, and state governments.

In addition to its subject tree, Yahoo also offers access to a search engine, which can be used to find Yahoo subject headings or to locate actual Web sites. When a search on Yahoo yields nothing, the server provides links to other Web search engines and allows the user or re - execute the search using a different engine.


## ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍යයට පහසු ප්‍රවේශයක්




රු.75/-




රු. 90/-




රු.70/-




රු. 100/-

**විමසීම්**

**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය**
**14, නිදහස් මාවත**
**කොළඹ 07**

---

අඩසියවසක් තුළ සිංහලයට පරිවර්තිත විශ්ව සාහිත්‍ය කෘති හඳුනා ගන්න

## සිංහල පරිවර්තන සාහිත්‍ය ග්‍රන්ථ නාමාවලිය
## 1947 - 1997

කර්තෘ, ග්‍රන්ථ නාම, පරිවර්තන සහ
පරිවර්තන ග්‍රන්ථ නාම අනුක්‍රමණිකා ඇතුළත් ය.

මිල රු. 130/-

**විමසීම**

*අධ්‍යක්ෂ*
*ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය*
*14, නිදහස් මාවත*
*කොළඹ 07.*

# ප්‍රාථමික ළමයින් තුළ කියවීමේ පුරුදු හා විඥාපන කුසලතා වැඩිදියුණු කිරීම

**නන්දා නාරන්ගොඩ**
*උප කර්තෘ*
**සිංහල ශබ්ද කෝෂය**

ප්‍රාථමික ළමයා තුළ කියවීමේ පුරුදු හා විඥාපන කුසලතා වැඩිදියුණු කළ යුත්තේ කෙසේ ද ? ඒ සඳහා අවධානය යොමුකල යුතු කරුණු මොනවා ද ? යන්න පිළිබඳ විමසීමේ දී විශේෂ අවධානයට යොමුවන කරුණු තුනක් සඳහන් කළ හැකිය. එනම්

* ප්‍රාථමික ළමයින්
* කියවීමේ පුරුදු
* විඥාපන කුසලතා

## ප්‍රාථමික ළමයා

ප්‍රථමයෙන් ම ප්‍රාථමික ළමයා යනු කවුරුන්දැයි හඳුනාගත යුතුයි. වයස අවුරුදු 5-10 අතර පාසැල් අධ්‍යාපනය ලබන දරුවා "ප්‍රාථමික දරුවා" වේ. මොවුන් නිවසටත් පාසලටත් ආධුනිකයන්ය. මේ දරුවා තුළ දැකිය හැකි විශේෂ ලක්‍ෂණය නම් තමා ජීවත්වන වටපිටාව "පිළිබඳ නිරතුරු කුතුහලයකින් පසුවීමයි. තමා අවට පරිසරය, පිළිබඳ ඉගෙනීමට දක්වන මෙම දැඩි ඇල්ම දරුවා හට සහජයෙන් ම ලැබෙන්නකි.

අද ප්‍රාථමික දරුවා 21 වන සියවසට පා ඔසවන්නෙකි. විවෘත ආර්ථික ප්‍රතිපත්ති මත වෙනස්වන සමාජයටත් දියුණුවන තාක්ෂණික ලෝකයේ අභියෝගයන්ටත් මුහුණ දිමට හැඩගැසෙන්නෙකි. දිනෙන් දින වෙනස්වන මෙම නවීන ලෝකයට මුහුණ දීමේ ශක්තිය තමා තුළ ඇති කර ගැනීමේ අභියෝගය කට ප්‍රාථමික දරුවා මුහුණ දී ඇත.

වෙනස්වන සමාජ ආර්ථික රටාව හා දිනෙන් දින දියුණුවන නව තාක්‍ෂණික මෙවලම් පිළිබඳ දරුවාගේ අවබෝධය පුළුල් කරගත හැක්කේ පත පොත කියවීමෙනි. මේ සඳහා දරුවා තුළ කියවීමේ පුරුද්ද ඇති කළ යුතුයි. එය දරුවාට අත්‍යවශ්‍යය.

රටක අධ්‍යාපන පද්ධතියේ එක් වැදගත් වගකීමක් වන්නේ ළමයාගේ කියවීම දියුණු කිරීමයි. එසේම සාක්‍ෂරතාව ලබා ගැනීම දරුවාගේ අයිතිවාසිකමකි. නව තාක්ෂණ ලෝකය වෙත පිවිසීමට දරුවාට අවශ්‍ය අවබෝධය, දැනුම දරුවා වෙත ලබා දීමට දෙමාපියන්, ගුරුවරුන් සූදානම් ද යන්න ගැටලුවකි.

සමාජ සම්බන්ධකම් හඳුනා ගැනීමට, එම සම්බන්ධතා දිගින් දිගට ම පවත්වාගෙන යාමට, හා තමා කවුද යනුවෙන් තමා පිළිබඳ ආත්ම සංකල්පයක් ගොඩනගා ගැනීමට මග පෙන්වන්නේ කියවීමයි. කියවීම ඉගෙනීමට උපකාරකයකි.

ලොව සංවර්ධිත රටවල්වල පවා ළමයා තුළ විඥාපන කුසලතා වර්ධනය කළ හැකි ක්‍රම පිළිබඳව පර්යේෂණ පවත්වමින් සිටීමෙන් පෙනී යන්නේ මෙය අද ජාත්‍යන්තර මට්ටමින් අවධානයට යොමු වී ඇති ගැටලුවක් බවට පත් වී ඇති බවයි.

## කියවීමේ පුරුදු

ප්‍රාථමික දරුවා තුළින් කියවීමේ පුරුදු බැහැර වී ඇත් ද ? එසේනම්, එය නැවත නගා සිටුවන්නේ කෙසේ ද ? යන්න පිළිබඳ පළමුවෙන් ම සොයා බැලිය යුතුයි. කියවීමේ පුරුදු දරුවා තුළින් බැහැර වීමට බලපාන ලද හේතු මොනවා ද යන්න සොයා බැලීමේ දී 1992 වසරේ දී ඒකනායක හා සේදර යන දෙදෙනා විසින් මේ සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණයක තොරතුරු බෙහෙවින් වැදගත් වේ. මෙම පර්යේෂණය තුළින් පෙන්නුම් කර තිබුණේ සම්පත් අහිමි දිස්ත්‍රික්ක 05ක පාසල්වල භාෂා දැනුම පිළිබඳ සොයාගත් තොරතුරුය. එම පර්යේෂණ තොරතුරු මගින් පහත සඳහන් කරුණු පෙන්වා දී ඇත.

* 1වසර සිසුන්ගෙන් 47%ක් භාෂා දැනුම අසමත්ය.
* 2 වසර සිසුන්ගේ 41%ක් භාෂා දැනුම අසමත්ය.
* අකුරු 2ක් හෝ 3ක් සහිත වචන හඳුනා ගැනීමේ ශක්තිය සලකා බැලිමේ දී

1 වසර හා 2 වසර සිසුන්ගෙන් 33% ක් අසමත්ය.

* තමාගේ නම ලිවීමට ඇති හැකියාව පිළිබඳ සලකා බලන විට 1වසර සිසුන්ගෙන් 30%කට නොහැකිය. 2 වසර සිසුන්ගෙන් 20%කට නොහැකිය.

* පන්තියකට අදාළ වාග්මාලාව පිළිබඳ සලකා බැලීමේ දී

3 වසර සිසුන්ගෙන් 50%කට නොහැකිය. 5 වසර සිසුන්ගෙන් 70%කට නොහැකිය.

මුල් කාලයේ දී දරුවාගේ අධ්‍යාපන මට්ටම ඉතා ඉහළ මට්ටමක පවතින අතර ඉන් ඉහළට යනවිට දරුවාගේ එම හැකියාව කෙමෙන් අඩු වී යන ප්‍රවනතාවක් දක්නට ලැබේ. 1995 වර්ෂයේ දී 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණය පදනම් කරගෙන ජාතික අධ්‍යාපන ආයතනය විසින් පර්යේෂණයක් කරන ලදී. එහිදී ලබාගත් පහත සඳහන් තොරතුරු මගින් මෙම තත්ත්වය තවදුරටත් පැහැදිලි වේ.

ලකුණු 10ට වඩා අඩුවෙන් ලබාගත් පිරිස 10% කි. ලකුණු 35ට වඩා අඩුවෙන් ලබාගත් පිරිස 50% කි. ලකුණු 50ට වඩා ලබාගත් පිරිස 26.2%කි. අසමත් පිරිස 60% කි.

ඒ හැරුණු විට අවුරුදු 5ක් තුළ ළමයා ලබාගෙන ඇති දැනුම කුමක් ද ? යන මාතෘකාව යටතේ 1995 වර්ෂයේ දී 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණය ඇසුරින් කරන ලද පර්යේෂණයෙන් පහත සඳහන් තොරතුරු හෙළි වී ඇත.

| | |
|---|---|
| සාක්ෂරතා දැනුම සමත් පිරිස | 21% |
| ගණිතය සමත් පිරිස | 13% |
| ජීවන කුසලතා සමත් පිරිස | 20% |

ප්‍රාථමික දරුවාගේ අධ්‍යාපන මට්ටම කෙතරම් දුරකට පහත බැස ඇතිදැයි මින් පැහැදිලි වේ. එම තත්ත්වයෙන් දරුවන් මුදවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමු කිරීමට කාලය පැමිණ ඇත. ඒ පිළිබඳව සිතිය යුත්තේ කෙසේ ද ? ඒ වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද ? යන ගැටලු සඳහා නිසි පිළිතුරු ලබා ගැනීම˙ ප්‍රාථමික ළමයින් තුළ කියවීමේ පුරුදු හා විඥාපන කුශලතා වැඩිදියුණු කිරීම˙ යනුවෙන් සිදු කරන ලද පර්යේෂණ යෙහි මුඛ්‍ය පරමාර්ථය විය.

## පර්යේෂණයේ අරමුණු

මෙම පර්යේෂණයෙහි අරමුණු පහත සඳහන් පරිදි පෙළගැස්විය හැකිය.

1. ළමයින් තුළ කියවීමේ පුරුද්ද හීන වීමට බලපෑ හේතු සාධක සොයා බැලීම.
2. ළමයින්ගේ කියවීමේ හැකියාව තීරණය කරන සුවිශේෂ සාධක, එනම් ළමයාගේ ගෙදර හා පාසල් පසුබිම පිළිබඳ සොයා බැලීම.
3. ළමයින්ගේ කියවීමේ හැකියාව හා සාධන මට්ටම අතර සම්බන්ධතාව, දිස්ත්‍රික් අනුව, පාසල් වර්ග අනුව, ගැහැණු පිරිමි භේදය අනුව සොයා බැලීම.
4. කියවීම පිළිබඳ ළමයි දක්වන ඇල්ම
5. කියවීම පිළිබඳ ගුරුවරුන්ගේ ආකල්ප, ළමයින්ගේ කියවීමේ පුරුද්ද පිළිබඳ ඔවුන් දක්වන අදහස් සොයා බැලීම.
6. ප්‍රාථමික ළමයින්ගේ සන්නිවේදන කුශලතා දියුණු කිරීමට නිර්දේශ කරන යම් යම් කරුණු පිළිබඳ සොයා බැලීම.

මෙම පර්යේෂණය සඳහා අනුරාධපුරය, කුරුණෑගල, මාතර හා කොළඹ යන දිස්ත්‍රික්ක 04ක නියැදියක් තෝරා ගනු ලැබිණ. මෙම දිස්ත්‍රික්ක 04ට ඇතුළත් පාසැල් 13ක් පහත සඳහන් පරිදි වර්ග 03කට බෙදා දැක්විණි.

1 වන වර්ගය - සාමාන්‍ය මට්ටමට භෞතික හා මානව සම්පත් ලැබෙන පාසල්

2 වන වර්ගය - සාමාන්‍ය මට්ටමට වඩා අඩුවෙන් භෞතික හා මානව සම්පත් ලැබෙන පාසල්

3 වන වර්ගය - සාමාන්‍ය මට්ටමට වඩා වැඩියෙන් භෞතික හා මානව සම්පත් ලැබෙන පාසල්

ඉහත වර්ගීකරණය සිදු කරන ලද්දේ ඒ ඒ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක වරුන්ගේ හා එම පාසල්වල ගුරුවරුන්ගෙන් ලබාගත් තොරතුරු මතයි. උසස් සමාජ හා ආර්ථික මට්ටමකින් යුතු වටපිටාවක් සහිත පාසල්වල සාධන මට්ටම වැඩි යයි මෙහිදී උපකල්පනයක් කරන ලදී.

මෙම නියැදිය සඳහා යොදා ගෙන ඇත්තේ 2 වසර හා 4 වසරයි. 1 වසරෙහි සිසුන්ගේ ප්‍රකාශන ශක්තිය මඳ බැවින් ද 5 වසර සිසුන් ශිෂ්‍යත්ව පරීක්ෂණය සඳහා සූදානම් වන බැවින් ද ඉහත වසර දෙක පමණක් මේ සඳහා යොදා ගැනීමට සිදු විය.

මෙහිදී 2 වසර සඳහා ප්‍රශ්න 06ක් යොමු කරන ලදී. ඒ සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍ර පසුබිම් කරගනු ලැබිණ.

* අකුරු හඳුනා ගැනීම
* වචන හඳුනා ගැනීම
* එම ශ්‍රේණියට අදාළ වාග් මාලාව පිළිබඳ අවබෝධය
* තමාගේ නම ලිවීමට ඇති හැකියාව

4 වසර සඳහා ප්‍රශ්න 07ක් යොමු කරන ලදී. එහිදී පසුබිම් කරගත් විෂය ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

* වාග්මාලා හැකියාව
* අක්ෂර වින්‍යාසය
* කියවීම අවබෝධය
* අනුමාන වශයෙන් වටහා ගැනීම
* ව්‍යාකරණානුකූලව ලිවීම
* නිර්මාණාත්මක රචනය
* තමාගේ නම, වයස, ලිපිනය, පාසලේ නම ලිවීමට ඇති හැකියාව.

දිස්ත්‍රික් 04න් ම ලබාගත් තොරතුරු අනුව සිසුන්ගේ සාධන මට්ටම පහත සඳහන් පරිදි කොටස් දෙකකට බෙදා ගත හැකි විය.

1 කොටස- සාමාන්‍ය ලකුණු 80% ට වඩා ලබාගත් අය (Masterly Level - ML) විශිෂ්ට මට්ටම.

2 කොටස - සාමාන්‍ය ලකුණු 30% ට වඩා අඩු අය (Sub Standard Level- SSL) අසමත්.

මුළු නියැදියෙහි ම 2 වසරෙහි සිසුන් සියලු දෙනා ම සාමාන්‍ය ලකුණු මට්ටම 80%කට වඩා ලබාගෙන විශිෂ්ට මට්ටමට පැමිණ සිටියහ. 4 වසරෙහි සිසුන්ගේ සාධන මට්ටම ඉතාමත් පහත් තලයක පැවතිණි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 4 වසර සිසුන් සියලු දෙනා ම සාමාන්‍ය ලකුණු මට්ටම 30%ට අඩුවෙන් ලබා ගෙන තිබිණි. කුරුණෑගල හා මාතර දිස්ත්‍රික්ක සලකා බලන විට, සාමාන්‍ය මට්ටමට හා සාමාන්‍ය මට්ටමට අඩු මානව හා භෞතික පහසුකම් සහිත පාසල්හි (පළමු වන වර්ගය හා දෙවන වර්ගයෙහි පාසල්හි) සිසුන් සියලු දෙනා ම 30% ට වඩා අඩු සාමාන්‍ය ලකුණු මට්ටමක් ලබාගෙන තිබුණි. මේ අනුව, දෙවන වසර සිසුනට වඩා 4 වසර සිසුන්ගේ සාධන මට්ටමෙහි පැහැදිලි ලෙස පහත බැසීමක් දක්නට ලැබිණි.

පවතින භෞතික හා මානව සම්පත් පදනම් කොට ගෙන කරන ලද පාසල් වර්ගීකරණය අනුව සිසුන් ලබා ගත් සාමාන්‍ය ලකුණු ද පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය.

1 වන වර්ගයේ පාසල්වල සිසුන් ලබාගත් සාමාන්‍ය ලකුණු මට්ටම 32% කි.

2 වන වර්ගයේ පාසල්වල සිසුන් ලබාගත් සාමාන්‍ය ලකුණු මට්ටම 38% කි.

3 වන වර්ගයේ පාසල්වල සිසුන් ලබාගත් සාමාන්‍ය ලකුණු මට්ටම 53% කි.

## භෞතික සම්පත් හා සාධන මට්ටම

පාසල සතු භෞතික හා මානව සම්පත් ප්‍රමාණය සිසුන්ගේ සාධන මට්ටම කෙරෙහි බලපාන බව මේ අනුව පෙනී යයි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි විශිෂ්ට මට්ටමට ළඟා වූ (සාමාන්‍ය ලකුණු මට්ටම 80%ට වැඩි වූ) කිසිවෙකු නැත. කුරුණෑගල හා මාතර දිස්ත්‍රික්කවල ගැහැණු ළමයි 5%ක් පිරිමි ළමයි 1.6%ක් විශිෂ්ට මට්ටමට ළඟා වී සිටියහ. කොළඹ දිස්ත්‍රික්කයෙහි ගැහැණු ළමයි 7%ක් පිරිමි ළමයි 3%ක් විශිෂ්ට මට්ටමට ළඟා වී සිටියහ. මේ අනුව බලන විට 4 වසර සිසුන්ගෙන් 50%ත් 67%ත් අතර ප්‍රමාණයක් ලබාගෙන ඇති සාමාන්‍ය ලකුණු ප්‍රමාණය 30%ට අඩුය. මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ නොවැම්බර් මාසයේ දී බැවින් වසර අවසානය වන විට ද මේ තරම් විශාල සිසුන් සංඛ්‍යාවක් පහත් සාධන මට්ටමක් පෙන්වීම ඉතාමත් භයානක තත්ත්වයකි.

මෙම තොරතුරු අනුව පැහැදිලි වන එක් කරුණක් වන්නේ සිසුන්ගේ සාධන මට්ටම කෙරෙහි එම පාසල සතු භෞතික හා මානව සම්පත් ප්‍රමාණය බලපාන බවයි. පහත සඳහන් තොරතුරු මගින් එය තවදුරටත් පැහැදිලි වේ.

1 වන වර්ගයේ පාසල් අතරින් සිසුන් 64%ක් අසමත්ය. 2 වන වර්ගයේ පාසල් අතරින් සිසුන් 57%ක් අසමත්ය. 3 වන වර්ගයේ පාසල් අතරින් සිසුන් 22%ක් අසමත්ය.

මෙහිදී සඳහන් කළ යුතු ඉතාමත් වැදගත් කරුණක් වන්නේ තමාගේ නම හරිහැටි ලියාගත නොහැකි වූ සිසුන් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීමයි. අනුරාධපුර දිස්ත්‍රික්කය 31%කට නොහැකිය. කුරුණෑගල දිස්ත්‍රික්කය 21%කට නොහැකිය මාතර දිස්ත්‍රික්කය 10%කට නොහැකිය. කොළඹ දිස්ත්‍රික්කය 11%කට නොහැකිය.

මෙවැනි අඩු සාධන මට්ටමක් ඇති සිසුන් පාසලින් ඉතා ඉක්මනින් ඉවත් වී යනු දැකිය හැකිය. ඔවුනට අවශ්‍ය පාසල් අධ්‍යාපනය නොලැබී යාම ගැටලුවකි. නවීන තාක්ෂණ ලෝකයට මුහුණදීමට මොවුනට ශක්තියක් ලැබේ යයි සිතිය නොහැක. තමා ගැන තොරතුරු පැවසීමේ හැකියාව පවා මේ දරුවන් වෙත නොමැති වීම ඉතාමත් කණගාටුදායකය.

කියවීම කෙරෙහි සිසුන් තුළ ඇති කැමැත්ත මැන බැලීම සඳහා, මීළඟට ආකල්ප පරීක්ෂණයක් පවත්වන ලදී. ඒ සඳහා සිසුන්ගේ ලැදියා ලේඛනයක් යොදා ගැනිණි. මෙහිදී, සිසුන්ගේ අභිරුචිය පහත සඳහන් අයුරින් ලේඛනගත කිරීමට අවස්ථාව ලබා දුණි. එය ස්වයං වාර්තා වක් ලෙස ද හැඳින්විය හැකිය.

1. විවේක කාලය මා ගත කිරීමට කැමති ආකාරය

මෙහිදී පහත සඳහන් අයුරින් වරණ 03ක් ලබා දී තිබුණි.

* සෙල්ලම් කිරීමෙන්
* බයිසිකල් පැදීමෙන්
* පොතක් කියවීමෙන්

මෙම අදහස විමසන ලද්දේ 2 වසර සිසුන්ගෙනි. ඔවුන්ගෙන් 64% ක් ම තම විවේක කාලය පොතක් කියවමින් ගත කිරීමට කැමැත්ත පළ කර තිබිණි.

2. මුදල් ඇතොත් මා මිල දී ගන්නේ කුමක් ද ?

4 වන වසර සිසුන්ගෙන් 40% ක් කතා පොතක් මිල දී ගැනීමට කැමතිය. ඉතිරියෙන් 30%ක් ළමා පත්තරයක් මිල දී ගැනීමට කැමතිය. 2 වසර සිසුන්ගෙන් 40%ක් කැමති

සෙල්ලම් බඩු මිල දී ගැනීමට හෝ පාට පැන්සල් පෙට්ටි මිල දී ගැනීමට හෝ නොව කතා පොතක් මිල දී ගැනීමටය.

3. කතාන්තර පොතක් ලැබුණ විට මම කැමති
   * පොතේ පින්තූර බැලීමට
   * පිටු පෙරලීමට
   * කතාන්තර ඇසීමට

2 වසර සිසුන් වෙත යොමු කරන ලද ඉහත වරණ තුනෙන් කතාන්තරයක් ඇසීමට 78%ක් ම කැමැත්ත දක්වා තිබිණ. දරුවන් කොපමණ අහිංසක ද? කියවීමට ඔවුන් වෙත ඇති කැමැත්ත කොපමණ ද? යන්න මේ අනුව අපට වටහා ගත හැකිය.

4. කියවීමට කැමති ම පොත් මොනවා ද? යන ප්‍රශ්නවලට පිළිතුර වශයෙන්

5 වසර සිසුන්ගෙන් 43%ක් අන්දරේ ගේ කතා ඇසීමට 4 වසර සිසුන් ගෙන් 56%ක් වීරකතා ඇසීමට කැමැත්ත පළ කර තිබිණ.

5. ජනමාධ්‍ය පිළිබඳ සිසුන්ගේ කැමැත්ත පහත සඳහන් පරිදි විය.
   රූපවාහිනී කාටූන් වැඩ සටහන් නැරඹීමට 54%ක් ගුවන් විදුලියේ අම්බිලි මාමා වැඩ සටහනට 53%ක්, බිංදු පත්තරය කියවීමට 64%ක් කැමතිය.

6. අකමැතිම විෂය කුමක්ද ?

මේ සඳහා සිසුන්ගේ පිළිතුරු පහත සඳහන් පරිදි විය.

* ගණිතයට කැමති 46%
* චිත්‍ර කර්මයට කැමති 21%
* සංගීතයට කැමති 15%

වැඩිදෙනෙකුගේ අකමැති ම විෂය වූයේ සිංහල භාෂාවයි.

සිසු දරුවන්ගේ සිංහල භාෂා දැනුම අවම මට්ටමක පැවතීමට මූලිකව ම බලපාන හේතුව මෙය විය හැකිය. සිංහල භාෂාව සඳහා ඉගෙනීමට ලැබෙන දෙය සිසුනට රුචි නොවේ. උගන්වන ආකාරය ද සිසුන් හට රුචි නැත.

භාෂාව පිළිබඳ දැන ගැනීමට පොත පත කියවීමට දරුවා ඉතා කැමැත්තක් දක්වන බව ඉහත තොරතුරු අනුව පැහැදිලිය. නමුත් ඒ සඳහා දරුවන් හට දෙමාපියන්ගෙන් හා ගුරුවරුන්ගෙන් ලැබෙන සහාය ඉතාමත් මඳ බව පෙනේ.

සිසුනගේ සාධන මට්ටම උස් පහත් වීම කෙරෙහි එම සිසු දරුවන්ගේ පවුල් පසුබිම ද බලපෑමක් ඇති කරන බව මෙහිදී උපකල්පනය කර ඇත. ඒ අනුව ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් ප්‍රශ්නාවලියට එක් කරගන්නා ලදී. එහිදී, පහත සඳහන් තොරතුරු ලැබිණි.

* අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුලෙහි සාමාජික සංඛ්‍යාව 5-10 අතර සිටින සිසුන් සංඛ්‍යාව වැඩිය.
* කොළඹ දිස්ත්‍රික්කයෙහි පවුලෙහි සාමාජික සංඛ්‍යාව 1-5 අතර සිටින සිසුන් සංඛ්‍යාව වැඩිය.

පවුලෙහි සාමාජික සංඛ්‍යාව වැඩිවන විට දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා වෙනුවෙන් වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය අඩුය. අමතර කියවීම් වශයෙන් පොතක්, පුවත්පතක් දරුවා වෙත ලබාදීමේ ශක්තිය හීන වේ.

අතිරේක කියවීම් පොත් 10 ක් ඇති පාසල් සංඛ්‍යාව
අනුරාධපුර දිස්ත්‍රික්කයේ 11% කි
කොළඹ දිස්ත්‍රික්කයේ 54% කි

සිසුන්ගේ සාධන මට්ටම කෙරෙහි බලපානු ලබන තවත් එක් සාධකයක් වන්නේ දරුවා ඉගෙන ගන්නා පාසලෙහි පසුබිමයි. නියැදිය සඳහා යොදාගත් පාසල් 13 අතරින් වාඩිවීමේ ඉඩකඩ, ගොඩනැගිලි, පන්තිකාමර වැනි අවම අවශ්‍යතා සපුරා ඇත්තේ පාසල් 04ක් පමණි. බොහෝ පාසල්වල පන්ති පැවැත්වෙන්නේ විශාල ශාලාවන් වලය. තවත් පාසැල්වල පන්ති පැවැත්වීම සඳහා සිසු දරුවන් වත්තට රැගෙන යනු දක්නට ලැබිණ. සිසුන් සමඟ යාමට හා ඒමට මෙහිදී විශාල කාලයක් වැය කළ යුතු ව ඇත. ගුරුවරයාගේ කාලය අපතේ යෑමක් සිදු වේ. ළමයාට ඉගෙනීමට ඇති කාලය මේ අනුව ඇහිරී යයි. සුපිරි පාසල්වල පවා අවශ්‍ය ප්‍රමාණයට වඩා සිසුන් පන්ති කාමරවල සිටිති. මේ අයුරින්, ඉගැන්වීම සඳහා ගුරුවරයාට මහත් වෙහෙසක් ගැනීමට සිදු ව ඇත. ඔවුන් වෙහෙසන ප්‍රමාණයට ලැබෙන ප්‍රතිඵලය අඩුය. එයට එක් හේතුවක් වන්නේ ගුරුවරයා ගේ පුද්ගලික අවධානය ඉතා අඩු වශයෙන් සිසුන් වෙත යොමුවීමයි.

පිට පළාත් දෙස බලනවිට එම දිස්ත්‍රික්කවල සිසුනට ඉගෙනීමට ඇති එකම මඟ, එකම සම්පත ගුරුවරයාය. ගුරුවරයාගේ පුහුණු නුපුහුණු බව ද දරුවාගේ සාධන මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කරයි. නියැදියට අයත් පාසල් 13 අතරින්

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරු 12ක් සිටිති. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරු 10ක් සිටිති. මාතර දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරු 04ක් සිටිති. කොළඹ දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරු 02ක් සිටිති.

සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ ගුරුවරුන්ගේ අදහස් ද මෙම පර්යේෂණයට ඇතුළත් කර ගැනුණි. එහිදී, ගුරුවරුන් විසින් පහත සඳහන් අදහස් දක්වා තිබිණි.

## විෂය නිර්දේශය

එක් වසරක් ඇතුළත අවසන් කළ යුතු ව ඇති විෂය නිර්දේශය ඉතා විශාල වීම, ඒ සඳහා ලැබෙන කාලය අවම වීම ගැටලුවක් බව.

මේ සම්බන්ධයෙන් සලකා බලනවිට ඇත්ත වශයෙන් ම 1 වසරේ සිට 5 වසර දක්වා විෂය නිර්දේශය පුලුල් ව පැවතිය යුතුයි.

විවිධත්වයක් තිබිය යුතුයි. ඒ ඒ වසරට අදාළ ව විෂය නිර්දේශයක් නියම කළ යුතු අතර එය ඒ ඒ පළාතට, ඒ ඒ සිසුනට අවශ්‍ය පරිදි විස්තීරණ කොට ඉගැන්වීමේ බලය ගුරුවරයා සතු වීම වඩාත් වැදගත් යයි පෙනේ.

## පෙළ පොත්

අදාළ සිංහල පෙළ පොත්වල අන්තර්ගත කතාවලින් ළමයින්ගේ හැඟීම් සහ කුතුහලය අවදි නොවේ. ඒ නිසා, ළමයින් ඒවා කියවීමට නොපෙළඹේ. ඒ අයට සිතීමට නිර්මාණාත්මක අවස්ථා නැත. අකුරු, වචන හඳුනා නොගෙන අර්ථය නොදැන කටපාඩමින් කියවීමට ළමයින් පුරුදු වී ඇත.

ඒ ඒ වසර සඳහා නියමිත එක් පොතක් තිබීම මෙම ගැටලුවට හේතුවයි. ළමයා එම පොත කටපාඩම් කර යන්ත්‍රයක් මෙන් කියවීමට පෙළඹේ. අඩු වශයෙන් 1,2,3 වසර සඳහාවත් අමතර කියවීම් පොත් කිහිපයක් තිබිය යුතුමය. එක් පොතක් පමණක් කියවීමෙන් ළමයා හට භාෂා කුසලතා වර්ධනය කරගත නොහැක.

## ජනමාධ්‍ය

ජනමාධ්‍ය හා කියවීමේ පුරුදු පිළිබඳ ගුරුවරුන්ගේ අදහස් විමසීමේ දී ඔවුන් වැඩි දෙනෙකුගේ අදහස වූයේ රූපවාහිනිය දරුවාගේ ඉගෙනීමට බාධාවක් වී ඇති බවයි. නමුත්, රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත වැනි ජනමාධ්‍ය දරුවාගේ භාෂා දැනීම වර්ධනය කිරීමට මෙන් ම දරුවාගේ බුද්ධි වර්ධනයට ද බෙහෙවින් රුකුල් දෙන්නේය. වරද ඇත්තේ එම ජනමාධ්‍යයන්හි නොව ඒවා භාවිත කරන ආකාරයෙහිය, දරුවා තනිව ම රූපවාහිනිය නැරඹීමේ දී දරුවාත් රූපවාහිනියත් අතර සිදුවන්නේ ඒකපාර්ශවික සන්නිවේදනයකි. ඉන් දරුවාගේ බුද්ධිවර්ධනයක් ඇති නොවේ. එබැවින්, සැමවිට ම ද්විපාර්ශවික සන්නිවේදනයකට ඉඩ සැලසිය යුතුය. උදාහරණයක් ලෙස දරුවා තනිව ම රූපවාහිනය නරඹනවා වෙනුවට වැඩිහිටියෙක් ද ඒ සඳහා සහභාගි විය යුතුයි. නරඹන වැඩසටහන පිළිබඳ දරුවා සමඟ සාකච්ඡා කරමින් එය නැරඹිය යුතුය. මේ අනුව ජනමාධ්‍ය දරුවාගේ බුද්ධිවර්ධනයට පිටිවහලක් කර ගැනීම දෙමාපියන්ගේ වගකීමක් වේ.

ඉහත දක්වන කරුණු අනුව ළමයින් තුළ ඇති භාෂා කුසලතා මට්ටම දුර්වල මට්ටමක පවතින බව පෙනී යයි. ඒ සඳහා බෙහෙවින් බලපාන්නේ පාසල්හි පවතින භෞතික හා මානව සම්පත් සීමා සහිත වීමයි. නියැදියෙහි සිසුන්ගෙන් 50%කට පමණ අවම වශයෙන් හෝ භෞතික හා මානව පහසුකම් ලැබී නොමැත.

මෙම තත්ත්වයෙන් මිදීම සඳහා මේ වන විට රජය විසින් ගනු ලැබූ පියවර මොනවා ද යන්න පිළිබඳවත්, ඒවා කෙතරම් දුරට සාර්ථක වී ඇති ද යන්න පිළිබඳවත් සලකා බැලිය යුතුයි. සිසුන් තුළ කියවීමේ පුරුදු වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් ධනාත්මක වශයෙන් ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබ ඇත. ඒ අනුව පහත සඳහන් ආයතන පිහිටුවා ඇත.

1. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
2. ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
3. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය
4. සංස්කෘතික අමාත්‍යංශයේ ග්‍රන්ථ ප්‍රකාශන අංශය
5. බ්‍රිතාන්‍ය කවුන්සිලය
6. ජාතික කෞතුකාගාර පුස්තකාලය

මේ හැරුණු විට විවිධ පුද්ගලික ආයතන මගින් ද ලේඛකයනට අතදීම, පොත් ප්‍රදර්ශන පැවැත්වීම, කියවීම දියුණු කිරීම සඳහා නොයෙකුත් උපක්‍රම හඳුන්වාදීම වැනි දේ සිදු කෙරේ.

එසේ වුව ද, ප්‍රාථමික දරුවන් හට කියවීමට ලැබෙන පොත්පත්වල ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක අඩුවක් ද පෙනෙන්නට ඇත.

## නිර්දේශ

මෙම පර්යේෂණයට අනුව, ප්‍රාථමික දරුවන් පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමු කර පහත සඳහන් පරිදි මට්ටම් 03කින් විශේෂ පොත්පත් ලබාදීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත.
එනම්,

* 1 වසර දක්වා එක් මට්ටමක්
* 2 සිට 3 දක්වා එක් මට්ටමක්
* 4 සිට 5 වසර දක්වා එක් මට්ටමක් යනුවෙනි.

ප්‍රාථමික දරුවාගේ ශාරීරික, මානසික අත්දැකීම් හා භාෂා වර්ධන මට්ටම් අනුව එම දරුවන් මෙසේ වර්ග කළ පසු, ලේඛකයන් ද ඒ අනුව පුහුණු කළ යුතුය. බොහෝ ලේඛකයන් විසින් ලියන ලද පොත් ප්‍රාථමික දරුවන් සඳහා කිසිසේත් ම සුදුසු නැත. දරුවන්ගේ මට්ටම් අනුව ලේඛකයෝ පුහුණු කිරීම අවශ්‍යය. ලේඛකයා දරුවාගේ භාෂා මට්ටම වටහාගත යුතුය. පොතේ ආකෘතිය හා පොතට ඇතුළත් කරනු ලබන චිත්‍ර වැනි දේ ගැන ලේඛකයා හට පුහුණුවක් ලබා දිය යුතුය. නිර්මාණාත්මක ලේඛකයන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි.

## පුස්තකාල පහසුකම්

සිසුන්ගේ පුස්තකාල පහසුකම් පිළිබඳ ව සලකා බැලීමේ දී පාසල් අතර පොත් බෙදා හැරීමේ විෂමතාවක් දක්නට ලැබිණ. නියැදිය සඳහා තෝරාගත් පාසල් අතරින්

පොත් 1000ට වඩා ඇති පාසල් සංඛ්‍යාව 03 කි. සුපිරි පාසල්වල පොත් 3000ත් 5000ත් අතර ප්‍රමාණයක් දක්නට ලැබිණි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි සමහර පාසල් සතු ව පැවතියේ පොත් 10ක් පමණි. මෙම විශාල පරතරය හැකි ඉක්මණින් අවම කරගත යුතු ව ඇත. සිසුන් කියවීමට කැමැත්තක් දක්වන බව පෙන්නුම් කර ඇතත් ඔවුනට කියවීමට පොත් නොමැති වීම විශාල ඛේදවාචකයකි. සමහර පාසල් සඳහා පරිත්‍යාග මගින් පොත් ලැබී තිබුණ ද ඒවා තැන්පත් කිරිමේ ඉඩකඩක් එම පාසල් සතු ව නොතිබිණි. පළාත් පාලන මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් අතින් අතට පොත් පත් බෙද හැරීමට කටයුතු කළ හැකි නම් එය ඉතාමත් වටින්නේය. එසේම එම පාසල් සඳහා විවිධ විෂයයන් යටතේ රචනා වූ පොත් ලබාදිය යුතුය.

පාසල් පුස්තකාල මෙන් ම පාසල් පුස්තකාලයාධිපතිවරයන්ගේ හා පුස්තකාල සහායකයන්ගේ හිඟ කම ද විශාල ගැටලුවක් ව පවතී. පාඨක පිරිසත් දැනට සිටින පුස්තකාලයාධිපතිවරුනුත් සලකා බැලීමේදී අනුපාතය 100 :1 කි. මේ තත්ත්වය මග හරවා ගැනීමට නම්, අඩු කාලයක් තුළ දී වැඩි පුස්තකාලයාධිපතිවරු පිරිසක් හා පුස්තකාල සහකාරවරු පිරිසක් පුහුණු කළ යුතු ව ඇත. මෙහිදී, සිසුන් අතර බෙදා දිය යුත්තේ කුමන පොත් පත් ද ? ඒවා බෙදා දිය යුත්තේ කෙසේ ද ? යන කරුණු පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කළ යුතු වන අතර, සිසුන් වෙත බෙදා දුන් පොත් ඔවුන් කියවනවා ද යන්න පිළිබඳව ද සොයා බැලිය යුතු ආකාරය පුහුණු කළ යුතුය. සිසුන්ගේ කියවීමේ ක්‍රම දියුණු කිරීම සඳහා යොදා ගත හැකි උපක්‍රම පිළිබඳව ද, මෙහිදී සැලකිල්ලක් යොමු කළ යුතුයි. එමෙන්ම, පුස්තකාලයෙහි තිබෙන පොත් පත් පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව ද සිසුන් දැනුවත් කළ යුතුයි. පොත්පත් කියවීමේ දී තමා කිය වූ පොතේ නම, කතුවරයාගේ නම ආදී තොරතුරු අභ්‍යාස පොතක ලියා තබා ගැනීමත්, කියවූ පොත් පිළිබඳ පන්ති කාමරය තුළ දී සාකච්ඡා කිරීමත් වැදගත්ය. පුස්තකාල පරිහරණය කරන නව ක්‍රම වශයෙන් ප්‍රශ්න පැය, කියවීම් සති වැනි දේ පළාත් මට්ටමින් හඳුන්වා දිය හැකිනම් ඉතා සුදුසුය.

කියවීමේ පුරුදු දරුවා තුළ වැඩිදියුණු වන සේ නිවසෙහි පරිසරය ද සකස් කිරීම දෙමාපියන් සතු වගකීමකි. ඒ සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කළ යුතුය. නිවසේ දී ජන ගායනා, ජන ක්‍රීඩා ජනකතා වැනි දේ දරුවා හට ඇසෙන්නට සැලැස්වීමෙන් දරුවාගේ බුද්ධි වර්ධනය දියුණු වේ. දරුවා තුළ ප්‍රබෝධයක් ඇති වේ.

ප්‍රාථමික දරුවාගේ භාෂා කුසලතා වර්ධනය නවීකරණය සඳහා කරන ලද යෝජනා පහත දැක්වේ.

1. කියවීම් සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම. පින්තූර, ජනකතා, චරිතාපදාන, විවිධ ළමා පොත්, ශබ්ද කෝෂ, කැසට්පටවලින් ද සමන්විත විය යුතුය.
2. භාෂා පර්යේෂණාගාරයක් පිහිටුවීම (විද්‍යා පීඨ හා ගුරු අභ්‍යාස විද්‍යාල ආශ්‍රිතව මෙය සිදු කල හැක)
3. ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් කිරිම.
4. ජාතික ළමා පොත් දිනයක් පැවැත්වීම (මෙදින ප්‍රාථමික ළමයින් විසින් ලියන ලද දේ සඳහා තෑගි ලබාදීම කළ යුතුය. මෙහිදී 'ප්‍රාථමික ළමයා' යන වචනයට විශේෂ තැනක් දිය යුතුයි)

[උක්ත මාතෘකාව යටතේ සිදු කරන ලද පර්යේෂණයක ප්‍රතිපල පිළිබඳව 1998 ජුනි 30 දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද දේශනයක් ඇසුරින් සකස් කරන ලද්දේ මුදිතා වැවලආරච්චි විසිනි]

(12 පිටුවෙන්)

විද්‍යා ක්ෂේත්‍රයෙහි සිටි දැවැන්තයෙක් අහිමි විය. එතැන් සිට ඔහුගේ දර්ශනයේ ඇතැම් අංග අභාවයට පත් විය. නමුත් ඔහු විසින් හඳුන්වා දෙන ලද නීති 05 පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය පවතින තාක් කල් භාවිත වන බව බොහෝ විද්වතුන්ගේ අදහසයි.

[1998 මාර්තු 26 දින ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවති දේශනයක් ඇසුරින් සකස් කරන ලද්දේ මුදිතා වැවලආරච්චි විසිනි]

පළවූ අළුත්ම පොත පත

පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට

බලන්න ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

## ප්‍රදර්ශන

1998 ජූලි - සැප්තැම්බර් කාලය තුළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පහත දැක්වෙන ස්ථානවල ප්‍රදර්ශන සංවිධානය කරන ලදී.

| | |
|---|---|
| සැප්. 22 - 28 | සාහිත්‍ය මාසය වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ දී |
| සැප්. 8 - 18 | යුනෙස්කෝ අරමුදලට ආධාර පිණිස කොළඹ මහජන පුස්තකාලයේ දී |
| සැප්. 10 - 12 | බැද්දේගම මහජන පුස්තකාලයේ දී |

## විදේශ චාරිකා

පරිගණක නව තොරතුරු තාක්ෂණය පුස්තකාල සඳහා යොදා ගැනීම පිළිබඳ අධ්‍යයන චාරිකාව 1998 අගෝස්තු 06 සිට 28 දක්වා ඇමෙරිකාවේ වොෂින්ටන් නගරයේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි මහතා ඒ සඳහා සහභාගි විය.

ආසියා පැසිපික් කලාපයේ පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු පාඨමාලාවක් 1998 ජූලි 01 සිට 28 දක්වා මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවර දී පවත්වන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලයාධිපති ජී.ඩී. අමරසිරි මහතා සහභාගි විය.

## International Programmes

USIA international visitors programme was held in Washington D.C. USA from 4 - 28 Auguest 1998. Mr. M.S.U. Amarasiri Director, SLNLSB participated this programme.

The training programme for Librarians from Asia and Oceania was held in Kualalumpur, Malayasia from 1-28 July 1998. Mr. G.D. Amarisiri, Librarian, SLNLSB participated this programme.

# පුස්තකාල ප්‍රවෘත්ති

### 19 වෙළුම 4 වන කලාපය

### 1998 ඔක්තොම්බර් - දෙසැම්බර්

## ඇතුළත් ලිපි

01. උදාවන නව තොරතුරු සමාජය හා එහි සුවිශේෂතා
    පියදාස රණසිංහ

02. தகவல் வலையச் செயற்பாடும் "இன்டநெற்" மகா வலயமும்
    எம்.பீ.எம். பைரூஸ்

03. A Living School Library
    Geetha Yapa

# NATIONAL LIBRARY OF SRI LANKA

**Services:**

Reference, Document Delivery; Inter Library Lending Bibliographical, Union Catalogue, Referrel, Reprographic etc. Institutional membership facilities are available.

**Collections:**

* Reference Materials - Encyclopedias, Dictionaries, Year Books, Maps and a collection of Rare books
* Newspaper Collection (from 1976) - Sinhalese, Tamil, English and International Newspapers
* Periodicals
* National & International News Magazines
* Science and Technology Collection
* Library Science Collection
* UNESCO Collection
* Collection of Ola Leaves
* A large collection of books on Economics, Political Science, Social Science, Religion, Linguistics, Geography, History, Art, Music, Sports etc.
* (CD- ROM) facilities for ' Science Citation Index' Library & Information Science Ab stracts (LISA PLUS) " HORTCD" and Current Contents on Diskette

**The Reader Services Division of the National Library is open from Tuesday to Saturday from 9.00 a.m. to 5.00 p.m.**

for further details, please contact:

Head
Reader services Division
National Library of Sri Lanka
14, Independence Avenue
Colombo 07

Tele: 685199, 698847

Fax: 685201

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature :

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature :

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*